සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2025

# 32 - ව්‍යාපාර අධ්‍යයනය

## ලකුණු දීමේ පටිපාටිය




මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

CamScanner

AL/2025/32/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | | | |
|---|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය I<br>வணிகக் கல்வி I<br>Business Studies I | 32 | S | I | 

*පැය දෙකයි*
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**උපදෙස්:**

- **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේම** සපයන්න.
- **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

**විභාග අංකය :** ..........................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**1.** ව්‍යාපාරයක් ආර්ථික ක්‍රියාකාරකමක් බවට පත්වන්නේ එය
(1) ප්‍රජා ව්‍යාපෘති සඳහා අනුග්‍රහය දක්වන නිසා ය.
(2) ලාභය සඳහා භාණ්ඩ හෝ සේවා හුවමාරුව සිදුකරන නිසා ය.
(3) සේවක ඇගයීම සඳහා සැමරුම් උත්සව සංවිධාන කරන නිසා ය.
(4) පරිසරය සුරැකීම සඳහා ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කරන නිසා ය.
(5) සංස්කෘතික ඒකාබද්ධතාව සඳහා දේශීය සම්ප්‍රදායන් ප්‍රවර්ධනය කරන නිසා ය.
(......)

**2.** පහත දැක්වෙන්නේ භාණ්ඩ හා සේවා සඳහා උදාහරණ කිහිපයකි.

A – ආහාර　　B – කොණ්ඩ කැපීම
C – ඉගැන්වීම　　D – ප්‍රචාරණය
E – රූපවාහිනිය　　F – ඇඳුම්
G – පුහුණුව　　H – තොගය
I – රථවාහන කුලියට දීම　　J – පරිගණකය

ඉහත දෑ අතුරෙන්, සේවා සඳහා අදාළ උදාහරණ පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, C, E, H, J　(2) A, D, E, G, I　(3) B, C, D, F, G
(4) B, C, D, G, I　(5) C, E, F, I, J
(......)

**3.** පහත වගුවෙහි ව්‍යාපාරයක් කෙරෙහි උනන්දුවන විවිධ පාර්ශ්ව සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් කිහිපයක් දැක්වේ.

| පාර්ශ්ව | ව්‍යාපාර ක්‍රියාකාරකම් |
|---|---|
| (i) රජය | A - සේවා නියුක්තියට දායකවීම |
| (ii) සේවකයින් | B - ඉහළ ගුණත්වයෙන් යුතු භාණ්ඩ මිලදී ගැනීම |
| (iii) ප්‍රජාව | C - ප්‍රසම්පාදන පටිපාටිය සරල කිරීම |
| (iv) සැපයුම්කරුවන් | D - නම්‍යශීලී වැඩ ක්‍රම ප්‍රවර්ධනය කිරීම |
| (v) ගනුදෙනුකරුවන් | E - නියමිත වේලාවට බදු ගෙවීම |

ඉහත දී ඇති පාර්ශ්ව අනුපිළිවෙළ අනුව එක් එක් පාර්ශ්වය උනන්දුවන ව්‍යාපාර ක්‍රියාකාරකම නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) A, B, D, E, C　(2) B, E, D, C, A　(3) C, E, D, B, A
(4) E, B, D, C, A　(5) E, D, A, C, B
(......)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

4. ව්‍යාපාරයක් එහි සේවකයින් වෙනුවෙන් ආචාරධර්ම හා බැඳුණු වගකීම දරන්නේ,
(1) නීති හා රෙගුලාසිවලට අවනතවීම තුළින් ය.
(2) සේවක අර්ථසාධක අරමුදලට දායකවීම තුළින් ය.
(3) විශ්වාසවන්ත රැකියා ස්ථානයක් ඇති කිරීම තුළින් ය.
(4) නව වෙළෙඳපොළවල් සොයා ගැනීම තුළින් ය.
(5) ගුණාත්මක නිෂ්පාදන සැපයීම තුළින් ය. (......)

5. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක් සඳහා බලපෑම් සිදුකරනු ලබන බලවේග කිහිපයකි.

A – වෘත්තීය සමිති
B – සැපයුම්කරුවන්
C – සේවකයින්
D – වැඩ සම්මත
E – තරගකරුවන්
F – සංවිධානමය සම්පත්
G – සංවිධානමය ප්‍රතිපත්ති
H – සමාජයීය ක්‍රියාකාරකම්
I – ගනුදෙනුකරුවන්
J – සංවිධාන ව්‍යුහය

ඉහත දෑ අතුරෙන්, ව්‍යාපාරයකට සෘජුව ම පාලනය කළ හැකි බලවේග පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, C, D, F, J
(2) B, C, F, G, J
(3) C, D, F, G, I
(4) C, D, F, G, J
(5) E, F, G, H, J
(......)

6. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා සඳහා ගෙවීම් කිරීමේ දී යොදාගනු ලබන නිල ඩිජිටල් ගෙවීම් වේදිකාව කුමක් ද?
(1) ඇපල්පේ (ApplePay)
(2) ගව්පේ (GovPay)
(3) ගූගල්පේ (GooglePay)
(4) පේපැල් (PayPal)
(5) පේහියර් (PayHere)
(......)

7. පහසු භාණ්ඩ සඳහා එකතු කළ අගය මත බද්ද (VAT) අවසානයේ ගෙවනු ලබන්නේ,
(1) නිෂ්පාදකයා ය.
(2) සිල්ලර වෙළෙන්දා ය.
(3) පාරිභෝගිකයා ය.
(4) බෙදාහරින්නා ය.
(5) තොග වෙළෙන්දා ය.
(......)

8. ශ්‍රී ලංකාවේ මහ බැංකුව මගින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වැඩි කිරීම, වාණිජ බැංකුවල ණය දීමේ ධාරිතාවයට සහ ව්‍යාපාරවල ණය ලබා ගැනීමේ පිරිවැයට බලපාන්නේ කෙසේ ද?

| | ණය දීමේ ධාරිතාව | ණය ලබා ගැනීමේ පිරිවැය |
|---|---|---|
| (1) | අඩු වේ. | වැඩි වේ. |
| (2) | වැඩි වේ. | අඩු වේ. |
| (3) | වෙනස් නොවේ. | වෙනස් නොවේ. |
| (4) | අඩු වේ. | අඩු වේ. |
| (5) | වැඩි වේ. | වැඩි වේ. |

(......)

9. පහත දැක්වෙන්නේ මූල්‍ය උපකරණ කිහිපයකි.

A – ස්වෛරීත්ව බැඳුම්කර
B – තැන්පතු සහතික
C – භාණ්ඩාගාර බිල්පත්
D – කොටස් බලපත්‍ර
E – ණයකර
F – භාණ්ඩාගාර බැඳුම්කර
G – සංවර්ධන බැඳුම්කර
H – වාණිජ පත්‍රිකා
I – හිමිකාරිත්ව කොටස්
J – සාංගමික බැඳුම්කර

ඉහත දෑ අතුරෙන්, සමාගම් විසින් නිකුත්කරනු ලබන මූල්‍ය උපකරණ පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, E, G, H, I
(2) B, D, F, H, I
(3) B, E, F, G, I
(4) D, E, H, I, J
(5) D, F, H, I, J
(......)

10. 'ව්‍යාපාර ඒකාබද්ධවීමක්' යනු
(1) ව්‍යාපාරයක මෙහෙයුම් කිහිපයක් වසා දැමීමයි.
(2) එක් ව්‍යාපාරයක් විසින් තවත් ව්‍යාපාරයක් අත්පත් කර ගැනීමයි.
(3) ව්‍යාපාරයක නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය කිරීමයි.
(4) ව්‍යාපාරයක වෙළෙඳපොළ කළඹ විවිධාංගීකරණය කිරීමයි.
(5) නව ව්‍යාපාරයක් ඇති කිරීමට සමාගම් දෙකක් එක් වීමයි. (......)

**11.** ව්‍යවසායකත්ව අදහස් ප්‍රායෝගිකත්වයට පත් කිරීමේ ක්‍රියාවලිය නම් කරනු ලබන්නේ,
(1) නවෝත්පාදන සොයාගැනීම ලෙස ය. (2) නිර්මාණකරණය ලෙස ය. (3) ප්‍රතිලාභ ලැබීම ලෙස ය.
(4) යථාර්ථයක් බවට පත් කිරීම ලෙස ය. (5) අත්හදා බැලීම ලෙස ය. (……)

**12.** අභ්‍යන්තර ව්‍යවසායකයෙකුගේ ප්‍රධාන ම ලක්ෂණය වන්නේ,
(1) ව්‍යාපාරයක් තුළ ඉහළ අවධානම භාර ගැනීම ය.
(2) නව ව්‍යාපාරවල ආයෝජනය කිරීම සඳහා හිමිකරුවන් උනන්දු කරලීම ය.
(3) ව්‍යාපාරයක ඵලදායීකත්වය වර්ධනය කිරීමට නව ක්‍රම සොයා බැලීම ය.
(4) ව්‍යාපාර තීරණ පිළිබඳ පූර්ණ පාලනය ඇතිකර ගැනීම ය.
(5) ව්‍යාපාර දැක්ම හා නිෂ්ටාව කෙරෙහි අවධානය යොමු කිරීම ය. (……)

**13.** පහත A සහ B යන ප්‍රකාශ සලකන්න.
**ප්‍රකාශ A** : හරිත ව්‍යාවසායකයින් ලාභ ඉපයීමකින් තොරව භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරනු ලැබේ.
**ප්‍රකාශ B** : හරිත ව්‍යාවසායකයින් පාරිසරික, ආර්ථික සහ සමාජයීය ගැටලු සඳහා නව විසඳුම් සංවර්ධනය කරනු ලැබේ.
ඉහත ප්‍රකාශ දෙක අතුරෙන්,
(1) **A** සත්‍ය වන අතර **B** අසත්‍ය වේ.
(2) **A** අසත්‍ය වන අතර **B** සත්‍ය වේ.
(3) **A** සහ **B** යන දෙක ම අසත්‍ය වේ.
(4) **A** සහ **B** යන දෙක ම සත්‍ය වන අතර **B** මගින් **A** පැහැදිලි කෙරේ.
(5) **A** සහ **B** යන දෙක ම සත්‍ය වන අතර **A** මගින් **B** පැහැදිලි කෙරේ. (……)

**14.** ශ්‍රී ලංකාවේ සීමිත ජාතික ණය සුරැකුම් ආයතනයේ (NCGIL) හිමිකාරිත්වය සතු වන්නේ,
(1) අර්ධ රාජ්‍ය අංශයට ය. (2) රාජ්‍ය අංශයට ය. (3) පෞද්ගලික අංශයට ය.
(4) සමූපකාර අංශයට ය. (5) පොදු හා පෞද්ගලික අංශයට ය. (……)

**15.** ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු මගින් ගිණුම් හිමියන් සඳහා සපයනු ලබන පහසුකම් කිහිපයක් පහත වේ.
A – චෙක් තැන්පතු B – ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM)
C – ජංගම බැංකු D – බැංකු අයිරා
E – කෙටි පණිවුඩ සේවා (SMS) F – තැන්පතු සඳහා පොලී
G – මූල්‍ය අත්තිකාරම් H – චෙක් පොත්
ඉහත දෑ අතුරෙන් ජංගම සහ ඉතුරුම් තැන්පතු යන ගිණුම් හිමියන් දෙදෙනාට ම ලබාගත හැකි පහසුකම් පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, C, E (2) A, C, E, F (3) B, C, E, G
(4) B, C, G, H (5) D, E, F, G (……)

**16.** පහත වගුව මගින් ගෙවීම් ආකාර සහ ඒවායේ ලක්ෂණ කිහිපයක් දැක්වේ.

| ගෙවීම් ආකාර | ලක්ෂණ |
|---|---|
| (i) බැංකු හුවමාරුව | A - දැන් මිලට ගෙන පසුව ගෙවීම |
| (ii) හරපත | B - යෙදවුමක භාවිතය (App based) |
| (iii) ණයපත | C - බැංකුවක් මගින් බැංකුවකට |
| (iv) විද්‍යුත් මුදල් පසුම්බිය | D - ක්ෂණික අඩුවීම |
| (v) මුදල් | E - ක්ෂණික ගෙවීම |

ඉහත දී ඇති ගෙවීම් ආකාර අනුපිළිවෙළ අනුව ඊට අදාළ ලක්ෂණ වඩාත් නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) B, A, C, D, E (2) C, A, D, E, B (3) C, D, A, B, E
(4) E, D, A, B, C (5) E, D, A, C, B (……)

**17.** නිෂ්පාදන ආපසු කැඳවීම් සම්බන්ධයෙන් ව්‍යාපාරවලට මූල්‍ය ආරක්ෂාව සැපයීමට ඇති රක්ෂණ ආවරණය කුමක් ද?
(1) ගිනි රක්ෂණය (2) පොදු වගකීම් රක්ෂණය
(3) මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය (4) සේවක වගකීම් රක්ෂණය
(5) නිෂ්පාදන වගකීම් රක්ෂණය (……)



CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



**18.** පහත වගුවේ දැක්වෙන්නේ විද්‍යුත් වේදිකා සහ ව්‍යාපාර සඳහා ඒවායේ ඇති සුවිශේෂී කාර්ය කිහිපයකි.

| විද්‍යුත් වේදිකා | කාර්ය |
|---|---|
| (i) සූම් (Zoom) | A - වෘත්තිකයන්ගේ ජාලය |
| (ii) එක්ස්(ට්විටර්) (X/Twitter) | B - වීඩියෝ මත පදනම් වූ ප්‍රචාරණය |
| (iii) යූටියුබ් (YouTube) | C - කෘත්‍රිම බුද්ධියෙන් බලගැන්වූ ව්‍යාපාරික අවබෝධය |
| (iv) ලින්ක්ඩ්ඉන් (LinkedIn) | D - සජීවී තාත්වික රැස්වීම් |
| (v) චැට්ජීපීටී (ChatGPT) | E - කෙටි පණිවුඩ හුවමාරුව |

ඉහත දී ඇති විද්‍යුත් වේදිකා අනුපිළිවෙළ අනුව ඊට අදාළ කාර්ය නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) B, A, D, E, C (2) B, D, C, A, E (3) C, D, E, A, B
(4) D, E, B, A, C (5) D, E, C, A, B (......)

**19.** භාණ්ඩ එහාමෙහා ගෙනයාම, ගබඩා කිරීම සහ බෙදාහැරීම යනාදී සමස්ත ක්‍රියාවලිය හඳුන්වන්නේ

(1) මිලට ගැනීම ලෙස ය. (2) ප්‍රවාහනය ලෙස ය.
(3) කාර්ය සම්පාදනය ලෙස ය. (4) ප්‍රසම්පාදනය ලෙස ය.
(5) බෙදාහැරීම ලෙස ය. (......)

**20.** ව්‍යාපාරයක් විසින් යොදාගනු ලබන උපායමාර්ග කිහිපයක් පහත දැක්වේ.

A – වරලත් ව්‍යාපාර B – වැඩ බාහිරකරණය
C – උපායමාර්ගික සන්ධාන D – ආනයන
E – බද්ධ ව්‍යාපාර F – අක්වෙරළ
G – අපනයන H – බලපත්‍ර

ඉහත දෑ අතුරෙන්, ජාත්‍යන්තර වෙළෙඳපොළවලට අවතීර්ණ වීම සඳහා ව්‍යාපාර විසින් යොදාගනු ලබන සාමූහික උපායමාර්ග පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C, H (2) A, C, E, H (3) C, D, E, G
(4) C, E, F, H (5) C, F, G, H (......)

**21.** පහත දෑ අතුරෙන්, B2C ගනුදෙනුවක් නිවැරදිව විස්තර කරන උදාහරණය තෝරන්න.

(1) දේශීය නිමි ඇඳුම් නිෂ්පාදකයකු විශාල රෙදි තොගයක් ආනයනය කිරීම
(2) පුද්ගලයකුට ලන්ඩන් යාම සඳහා ගුවන්යානා ටිකට් පතක් නියෝජිතයකු විසින් අලෙවි කිරීම
(3) පුද්ගලයකු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ආදායම් බදු ගෙවීම
(4) සමාගමක් ශ්‍රී ලංකා රේගුවට ආනයන තීරුබදු ගෙවීම
(5) පුද්ගලයකු මාර්ගගත වේදිකාව හරහා තම වාහනය අලෙවි කිරීම (......)

**22.** පහත වගුවේ දැක්වෙන්නේ කළමනාකරණ ශ්‍රිත සහ ඒවායේ විස්තර කිහිපයකි.

| ශ්‍රිත | විස්තර |
|---|---|
| (i) සැලසුම්කරණය | A - නිවැරදි නියාමනය සහ අගය කිරීම් පද්ධති ස්ථාපිත කිරීම |
| (ii) සංවිධානකරණය | B - සංවිධානමය පරමාර්ථ සහ ක්‍රියාමාර්ග තෝරා ගැනීම |
| (iii) මෙහෙයවීම | C - අභිප්‍රේරණය, සම්බන්ධීකරණය සහ සේවකයන් බලගැන්වීම |
| (iv) පාලනය | D - කාර්යය සහ බල අධිකාරිය අතර සම්බන්ධතාව ස්ථාපිත කිරීම |

ඉහත දී ඇති ශ්‍රිත අනුපිළිවෙළ අනුව ඊට අදාළ විස්තර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, D, B (2) B, C, D, A (3) B, D, C, A
(4) C, B, D, A (5) C, D, A, B (......)


**23.** මුළු ස්ථාවර පිරිවැය රු. 120,000 ක් සහ දායකත්ව ආන්තික අනුපාතය 60% ක් වේ නම්, සමච්ඡේදන ලක්ෂ්‍යය රුපියල්වලින් කොපමණද?

(1) රු. 2 000 (2) රු. 12 000 (3) රු. 20 000
(4) රු. 200 000 (5) රු. 720 000 (......)



CamScanner

**24.** පහත දැක්වෙන සංවිධාන සටහන සලකන්න.




ඉහත දී ඇති සටහන මගින් නිරූපණය වන සංවිධාන ව්‍යුහය නිවැරදිව සඳහන් කර ඇති වරණය තෝරන්න.

(1) සරල ව්‍යුහය　(2) ආංශික ව්‍යුහය　(3) ශ්‍රිතමය ව්‍යුහය
(4) පැතලි ව්‍යුහය　(5) න්‍යාස ව්‍යුහය　(......)

**25.** කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් නිශ්චිත වෙළෙන්දෙකුට අයත් බව පෙන්නුම් කරන්නේ කුමන බුද්ධිමය දේපළ මගින් ද?

(1) ප්‍රකාශන අයිතිය　(2) පේටන්ට් බලපත්‍රය　(3) වෙළෙඳ රහස්
(4) වෙළෙඳ ලකුණු　(5) කාර්මික මෝස්තර　(......)

**26.** පහත වගුවේ සමාගමක නිෂ්පාදන මිශ්‍ර පිළිබඳව නිර්ණායක සහ ඒවාට අදාළ විස්තර කිහිපයක් දැක්වේ.

| නිර්ණායක | විස්තර |
|---|---|
| (i) පළල | A - එක් එක් නිෂ්පාදන පෙළ තුළ ඇති විවිධත්වය |
| (ii) දිග | B - වෙනස් නිෂ්පාදන පෙළවල් ගණන |
| (iii) ගැඹුර | C - නිෂ්පාදන පෙළවල් එක ම බෙදාහැරීම් මාර්ගය භාවිත කිරීම |
| (iv) සංගතබව | D - සියලු ම නිෂ්පාදන පෙළවල්වල මුළු නිෂ්පාදිත සංඛ්‍යාව |

ඉහත දී ඇති නිර්ණායක අනුපිළිවෙළ අනුව ඊට අදාළ විස්තරය නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, D, B　(2) B, A, D, C　(3) B, D, A, C　(4) D, A, C, B　(5) D, B, A, C　(......)

**27.** පහත වගුවේ සේවක පුහුණු ක්‍රම කිහිපයක් සහ ඒවායේ විස්තර දැක්වේ.

| පුහුණු ක්‍රම | විස්තර |
|---|---|
| (i) උපදේශනය | A - සැබෑ ජීවිතයේ සිද්ධීන් අනුකරණය තුළින් ඉගෙනුම |
| (ii) සමාකරණය | B - වෙනස් රැකියා භූමිකා ඉගෙනුම |
| (iii) රැකියාව මගින් | C - රැකියා පරිසරයෙන් බාහිරව ඉගෙනුම |
| (iv) රැකියා භ්‍රමණය | D - රැකියා කාර්යයන් ඉටුකරමින් ඉගෙනුම |
| (v) රැකියාවෙන් පිටත | E - එකිනෙකා අතර මඟපෙන්වීම මත ඉගෙනුම |

ඉහත දී ඇති පුහුණු ක්‍රම අනුපිළිවෙළ අනුව ඊට අදාළ විස්තර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, D, B, E　(2) C, A, D, B, E　(3) C, E, B, D, A
(4) E, A, D, B, C　(5) E, D, A, C, B
(......)

**28.** පහත ඳ අතුරෙන් ව්‍යාපාරයක සේවක කාර්යසාධනය පෙන්නුම් කරන්නේ කුමන සාධකය මගින් ද?

(1) සේවක ඵලදායීතාව　(2) සේවක ආරවුල්
(3) සේවක පැමිණීම　(4) වැඩ කළ පැය ගණන
(5) පුහුණු පැය ගණන
(......)

**29.** ව්‍යාපාරයක් හා සම්බන්ධ දත්ත හා තොරතුරු පහත දැක්වේ.

A – සාමාන්‍ය දෛනික විකුණුම්: ඒකක 5　　B – දෛනික විකුණුම්: ඒකක 100
C – සාමාන්‍ය පිරිවැටුම් අනුපාතය: 3%　　D – ණයගැති පිරිවැටුම් අනුපාතය: 10%
E – සමස්ත කාර්යසාධන ලකුණ: 93　　F – මිල දී ගැනුම්: ඒකක 300
G – තොගය: ඒකක 1 000　　H – ඉහළ විකුණුම් උපනතිය: රු. 100 000

ඉහත ඳ අතුරෙන්, තොරතුරු පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C, D, H　(2) A, C, D, E, H　(3) B, C, D, F, G
(4) D, E, F, G, H　(5) D, E, F, H, G　(......)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

**30.** තීරණ ගැනීම සඳහා කළමනාකරුවන්ට සහය වීමට දත්ත එකතු කිරීම, සැකසීම, ගබඩා කිරීම හා බෙදාහැරීම සිදු කරනු ලබන්නේ කුමන තොරතුරු පද්ධතිය ද?
(1) විධායක උපකාරක පද්ධති (ESS)
(2) කළමනාකරණ තොරතුරු පද්ධති (MIS)
(3) තීරණ උපකාරක පද්ධති (DSS)
(4) ගනුදෙනු සැකසුම් පද්ධති (TPS)
(5) දැනුම් කාර්ය පද්ධති (KWS) (......)

● අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචනය/වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) මිනිස් තෘප්තිය වැඩිදියුණු කිරීම සඳහා කිසියම් භාණ්ඩයකට ඇති කැමැත්ත .................... ලෙස ද මානව පැවැත්ම සඳහා අත්‍යවශ්‍යයෙන් ම සපුරා ගත යුතු දෑ .................... ලෙස ද හැඳින්වේ.

(ආ) හවුල් ව්‍යාපාරයක .................... පුද්ගලභාවයක් නොමැති නිසා හවුල්කරුවන්ගේ වගකීම් .................... වේ.

**32.** (අ) ශ්‍රී ලංකාවේ සම්මත එකතු කළ අගය මත බදු (VAT) අනුපාතය සියයට .................... ක් වන අතර අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) උපරිම ප්‍රතිශතය .................... කි.

(ආ) කොටස් හිමියන් වෙත වාර්ෂික මූල්‍ය වාර්තාවක් යැවීම .................... සන්නිවේදන මාධ්‍යය සඳහා උදාහරණයක් වන අතර මිතුරෙකු සමග ව්‍යාපෘති අදහසක් අවන්හලකදී සාකච්ඡා කිරීම .................... සන්නිවේදන මාධ්‍යය සඳහා උදාහරණයකි.

**33.** (අ) S&P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය පිළියෙල කිරීමේ දී ද්‍රවශීලතාව, මූල්‍ය .................... සහ වෙළෙඳපොළ .................... මත අදාළ සමාගම් 20 තෝරාගනු ලැබේ.

(ආ) ව්‍යාපාර විවිධාංගීකරණය දිගුකාලීන .................... තීරණයක් සඳහා උදාහරණයක් වන අතර ලාභාංශ තීරණය දිගුකාලීන .................... තීරණයක් සඳහා උදාහරණයක් වේ.

**34.** (අ) දෝෂ වැළැක්වීම මුල් කරගත් 'ක්‍රියාවලි-අභිමුඛ' ප්‍රවේශය, තත්ත්ව .................... වන අතර දෝෂ හඳුනාගැනීම මුල් කරගත් 'නිෂ්පාදන-අභිමුඛ' ප්‍රවේශය, තත්ත්ව ....................වේ.

(ආ) නිෂ්පාදන ඒකකයක් නිපදවීමට ගතවන කාලය .................... කාලය ලෙස ද ඇනවුම් කිරීමේ සිට එය ලැබීම දක්වා වන කාලය .................... කාලය ලෙස ද හැඳින්වේ.

**35.** (අ) නිෂ්පාදිතයක් කෙරෙහි සුවිශේෂී පාරිභෝගික කණ්ඩායමක් ආකර්ෂණය කරගැනීම .................... වෙළෙඳපොළ ලෙස ද නිෂ්පාදිතයක් කෙරෙහි ඔවුන්ගේ මනස තුළ ධනාත්මක ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම වෙළෙඳපොළ .................... ලෙස ද හැඳින්වේ.

(ආ) චොක්ලට් දැවටුමක් .................... ඇසුරුමකට උදාහරණයක් වන අතර චොක්ලට් කිහිපයක් අඩංගු පෙට්ටියක් .................... ඇසුරුමකට උදාහරණයක් වේ.

**36.** (අ) සමාගමක අධිතෝලන අනුපාතය .................... මූල්‍යය මත වැඩි රඳා පැවැත්මක් පෙන්නුම් කරන අතර අවතෝලන අනුපාතය .................... මූල්‍යය මත වැඩි රඳා පැවැත්මක් පෙන්නුම් කරයි.

(ආ) කොටස්වල නාමික අගය ඉක්මවා ආයෝජකයින් විසින් ගෙවනු ලබන වටිනාකම කොටස් .................... ලෙස ද, ගැනුම් මිලට වඩා වැඩි මිලකට කොටස් අලෙවි කිරීමෙන් ලබන ලාභය .................... ලාභ ලෙස ද නම් කෙරේ.

**37.** (අ) රැකියාවක කාර්යයන් වැඩි කිරීම රැකියා .................... ලෙස ද රැකියාවක ස්වාධීනතාව වැඩි කිරීම රැකියා .................... ලෙස ද හඳුන්වනු ලැබේ.

(ආ) විෂමාචාරයක් මත සේවයා විසින් සේවකයකු සේවයෙන් පහ කිරීම සේවය .................... කිරීම ලෙස ද වන්දි ගෙවීමේ පදනම මත අතිරික්ත සේවකයින් සඳහා වන ඉල්ලා අස්වීමේ යෝජනා ක්‍රමය .................... ඉල්ලා අස්වීම ලෙස ද හැඳින්වේ.


CamScanner

38. (අ) ව්‍යාපාර සැලසුමක මූලික කරුණු ඉදිරිපත් කරනු ලබන්නේ ..................... සාරාංශය මගින් වන අතර ව්‍යාපාරයක සමස්ත නිෂ්පාදන ක්‍රියාපටිපාටිය ඉදිරිපත් කරනු ලබන්නේ ..................... සැලසුම මගිනි.

(ආ) කාර්යාලයක් තුළ ඇති පරිගණක ජාල ආවරණයක් ..................... ක්ෂේත්‍ර ජාලයට උදාහරණයක් වන අතර රටක් සඳහා ඇති පරිගණක ජාල ආවරණයක් ..................... ක්ෂේත්‍ර ජාලයට උදාහරණයක් වේ.

39. (අ) ISO ..................... අවධානය යොමු කරනුයේ පාරිසරික කළමනාකරණ පද්ධති කෙරෙහි වන අතර ISO ..................... අවධානය යොමු කරනුයේ බලශක්ති කළමනාකරණ පද්ධති කෙරෙහි ය.

(ආ) වැරදිකාර පාර්ශ්වයකින් රක්ෂණ සමාගමට ගෙවීම් ප්‍රතිපූර්ණය කර ගැනීමට ඇති අයිතිය ..................... මූලධර්මය ලෙස හඳුන්වන අතර රක්ෂණ සමාගම් කිහිපයක් මගින් එක ම ආවරණය සඳහා වන්දි ගෙවීමේ මූලධර්මය ..................... ලෙස හඳුන්වයි.

40. (අ) භාණ්ඩ නැව්ගත කිරීමට පෙර අපනයනකරු විසින් ආනයනකරු වෙත යවනු ලබන්නේ ..................... ඉන්වොයිසිය වන අතර භාණ්ඩ නැව්ගත කිරීමෙන් පසු ආනයනකරුට යවනු ලබන්නේ ..................... ඉන්වොයිසිය ය.

(ආ) ආනයනයෙන් පසුව අගය එකතු කරන ලද භාණ්ඩ අපනයන කිරීම ..................... වෙළෙඳාම වන අතර අවසාන ගමනාන්තයට ළඟාවීමට පෙර අතරමැදි වරායක දී නැවකින් වෙනත් නැවකට භාණ්ඩ මාරු කිරීමේ ක්‍රියාවලිය ..................... කිරීම වේ.

- අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට **සුදුසු පිළිතුරු** දී ඇති හිස්තැන් මත ලියන්න.

41. ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී තනි ව්‍යාපාරිකයකු හට ප්‍රාග්ධනය සපයා ගත හැකි ආකාර **හතරක්** ලියන්න.

(1) .....................................................................................................

(2) .....................................................................................................

(3) .....................................................................................................

(4) .....................................................................................................

42. ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාර වර්ග **හතරක්** සඳහන් කරන්න.

(1) .....................................................................................................

(2) .....................................................................................................

(3) .....................................................................................................

(4) .....................................................................................................

43. ජාත්‍යන්තර වෙළෙඳාමේ දී අපනයනකරුවකුට ගෙවීම් සිදු කළ හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න.

(1) .....................................................................................................

(2) .....................................................................................................

(3) .....................................................................................................

(4) .....................................................................................................

44. ව්‍යාපාරයක් සඳහා වලාකුළු පරිගණනය (Cloud based computing) භාවිත කිරීමෙන් ඇතිවන ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න.

(1) .....................................................................................................

(2) .....................................................................................................

(3) .....................................................................................................

(4) .....................................................................................................



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

CamScanner

45. කම්හල් පිරියත වර්ග **හතරක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

46. මෝටර් රථ ව්‍යාපාරයක සැපයුම්දාමයට සම්බන්ධවන පාර්ශ්ව **හතරක්** නම් කරන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

47. සමාගමක අරමුණු ඉටු කර ගැනීමට කළමනාකරණය දායක වන ආකාර **හතරක්** ලියන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

48. ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව මූල්‍ය ආයතන වර්ග **හතරක්** නම් කරන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

49. පහත දක්වා ඇති එක් එක් සිදුවීම, ව්‍යාපාරයක් සඳහා ශක්තියක්, දුර්වලතාවයක්, අවස්ථාවක් හෝ තර්ජනයක් (ශදුඅත)/(SWOT) යන ඒවායින් කවරක් ද යන්න නිවැරදිව සඳහන් කරන්න.

| සිදුවීම් | ශදුඅත/(SWOT) |
|---|---|
| (A) විශ්වවිද්‍යාල සමග හවුල්වීම | (1) .............................. |
| (B) කාර්යක්ෂම පුහුණු වැඩසටහන් මෙහෙයවීම | (2) .............................. |
| (C) ශ්‍රම වෙළෙඳපොළෙහි කුසලතා හිඟය | (3) .............................. |
| (D) දුර්වල සේවක කැපවීම පෙන්නුම් කිරීම | (4) .............................. |

50. පහතින් දැක්වෙන ජාත්‍යන්තර වශයෙන් භාවිත වන එක් එක් මුදල් කෙටි යෙදුමට අදාළ නිවැරදි නම ලියන්න.

(1) USD : ..............................

(2) JPY : ..............................

(3) GBP : ..............................

(4) LKR : ..............................

* * *



CamScanner

AL/2025/32/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

**32 S II**

පැය තුනයි
*மூன்று மணித்தியாலம்*
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**
※ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. කර්මාන්තයට නවකයින් වූ ඉංජිනේරුවන් දෙදෙනකු විසින් 'බෙස්ට් ලීව්' හෝටලය ආරම්භ කරන ලදී. මෙහි ගනුදෙනුකරුවන්ට කැපවීමෙන් සේවය කරන අත්දැකීම් හා කුසලතා සහිත, ස්ථිර සහ දෛනික වැටුප් පදනම යටතේ සේවකයන් පනස්දෙනකු සේවයේ නියුක්ත වේ. කෙසේ වෙතත්, දෛනික වැටුප් ලබන සේවකයින්ගේ පිරිවැටුම කර්මාන්තයේ සාමාන්‍ය අගයට වඩා ඉහළ බව අයිතිකරුවන් විසින් නිරීක්ෂණය කර ඇත. හෝටලය නිරතුරුව ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලිකත්වය සුරැකීමට කටයුතු කරන අතර ඔවුන්ට සෑමවිට ම ගෞරවාන්විතව සත්කාර කරනු ලබයි. අමුත්තන්ගේ නවාතැන් ස්ථාන පිරිසිදුව තබා ගැනීම, ආරක්ෂාව හා අලංකාරවත් බව තහවුරු කිරීම මෙන්ම ප්‍රණීත, කාබනික හා සෞඛ්‍ය සම්පන්න ආහාර සපයමින් ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂා ඉටු කිරීමට හෝටලය නිරතුරුව ම කටයුතු කරයි. එමෙන්ම රජය විසින් විදෙස් තානාපති කාර්යාල මගින් සහ වෙනත් ප්‍රචාරණ කටයුතු හරහා සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනයට කටයුතු කළ ද ඇතැම් බලපෑම් කළ හැකි කණ්ඩායම් විසින් සංචාරක කර්මාන්තයට විරෝධතාව ප්‍රකාශ කර ඇත.

(i) (අ) බෙස්ට් ලීව් හෝටලය විසින් ඉටු කරනු ලබන ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) බෙස්ට් ලීව් හෝටලය විසින් අවධානය යොමු කරන ගනුදෙනුකරුවන්ගේ වුවමනා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) බෙස්ට් ලීව් හෝටලයට ආර්ථික සංවර්ධනයට දායක විය හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා මෙම හෝටලය භාවිත කරනු ලබන උපායමාර්ග **දෙකක්** හඳුන්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ඉහත සිද්ධියේ සඳහන් වන ඇල්මැති පාර්ශ්වකරුවන් **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත සිද්ධිය පාදක කරගෙන සංචාරක කර්මාන්තය මුහුණදෙන අවස්ථාවක් සහ තර්ජනයක් හඳුන්වන්න. (ලකුණු 02 යි)

(iv) බෙස්ට් ලීව් හෝටලයේ දුර්වලතා **දෙකක්** සඳහන් කර, එම එක් එක් දුර්වලතාව තුළින් හෝටලයට ඇතිවන එක් බලපෑම බැගින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) පරිසර තිරසරභාවය පවත්වා ගැනීමට මෙම හෝටලයට සිදුකළ හැකි මූලික ක්‍රියාකාරකම් **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම හෝටලයට අනුගමනය කළ හැකි ආචාරධර්ම භාවිත **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

2. අයේෂා සහ රුවිනි සුළු පරිමාණ හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය දේශීය අමුද්‍රව්‍ය භාවිත කර නිපදවූ සාම්ප්‍රදායික අත්කම් භාණ්ඩ අලෙවි කරනු ලබයි. ඔවුන් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ 'නිර්මානී' ලෙස හවුල් ව්‍යාපාරය ලියාපදිංචි කරන ලද අතර අනෙකුත් නීතිමය අවශ්‍යතා සඳහා එය කම්කරු දෙපාර්තමේන්තුවේ ද ලියාපදිංචි කරන ලදී.

(i) (අ) හවුල් ව්‍යාපාර ගිවිසුමක් හවුල් ව්‍යාපාර ඔප්පුවකින් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 02 යි)

(ආ) හවුල් ව්‍යාපාර ඔප්පුවකින් ව්‍යාපාරයකට අත්වන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

(ii) (අ) අපේක්ෂා සහ රුවිනි ඔවුන්ගේ හවුල් ව්‍යාපාරය ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කළේ ඇයි දැයි හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත සිද්ධියේ සඳහන් ව්‍යාපාරය කම්කරු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාව කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) සීමිත පෞද්ගලික සමාගමකට සාපේක්ෂව හවුල් ව්‍යාපාරයක පවතින සීමා **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාර වර්ගීකරණ පදනම් යටතේ නිෂ්පාදනයේ ස්වභාවය අනුව මෙම හවුල් ව්‍යාපාරය අයත් වන්නේ කවර වර්ගයකට දැයි නම් කර, ඊට හේතුවක් දක්වන්න. (ලකුණු 02 යි)

(iv) (අ) දේශීය අමුද්‍රව්‍ය භාවිත කිරීමෙන් ආර්ථිකයට ලබාගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) අපේක්ෂා සහ රුවනිට සංචාරකයින් අතර ඔවුන්ගේ ව්‍යාපාරයේ විකුණුම් පරිමාව වැඩි කරගැනීමට යොදාගත හැකි ක්‍රම **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) මෙම ව්‍යාපාරයට 'නිර්මානී' යන නමින් ජංගම ගිණුමක් ඇරඹිය හැකි ද? ඔබේ පිළිතුරට හේතුවක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) චෙක්පතක 'ගනුදෙනු කළ නොහැක' සහ 'ආදායකයාගේ ගිණුමට පමණයි' යන රේඛන අතර ඇති වෙනස දක්වන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

3. (i) (අ) ව්‍යවසායකයා ව්‍යවසායකත්වයෙන් වෙනස් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යවසායකයින්ගේ සාර්ථකත්වය කෙරෙහි තරගකාරිත්වය බලපාන ආකාර **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) බැංකු මුදල් හා ආසන්න මුදල් අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) චෙක්පතක 'සීමාකාරී පිටසන' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(iii) (අ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (SLC) මගින් ව්‍යාපාරයකට ලබාගත හැකි වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ආර්ථිකයක මිල ස්ථායීතාවය ව්‍යාපාරයක් සඳහා වැදගත් වන්නේ ඇයි දැයි හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iv) (අ) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමේ (IRCSL) භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් විසින් පිරිනමනු ලබන සාමාන්‍ය රක්ෂණ වර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) ව්‍යාපාරයක් සඳහා සමාජ මාධ්‍ය භාවිතය තුළින් අත්වන අවාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) අතරමැදිකරණයෙන් තොර විද්‍යුත් වාණිජ්‍යය නිසා පාරිභෝගිකයකුට අත්වන වාසි **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

4. (i) (අ) ක්‍රම කාර්ය සම්පාදනයේ දී ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීමෙන් ව්‍යාපාරයකට අත්වන වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) පාරිභෝගිකයා වෙත ඇතැම් නිෂ්පාදන ඉක්මනින් සහ වේගවත්ව බෙදාහැරීම සිදුකළ යුතු අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ස්වයංක්‍රීය ගබඩා පද්ධතියකින් ව්‍යාපාරයකට ඇති ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'කොමිස් නියෝජිතයා' සහ 'තැරැව්කරු' අතර ඇති වෙනස හඳුන්වා දෙන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ප්‍රවාහනයේ දී බහලුම්ගතකරණය මගින් ආනයනකරුට අත්වන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) නැව තෙක් නොමිලේ (FOB) සහ පිරිවැය, රක්ෂණ සහ ගැල්කුලිය (CIF) යන මිල කිරීම් අතර ඇති වෙනස්කම කුමක් ද? (ලකුණු 02 යි)

(iv) (අ) ජාත්‍යන්තර වෙළෙඳාමේ දී භාවිත වන ප්‍රභවස්ථාන සහතිකයේ අරමුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) විද්‍යුත් ව්‍යාපාර, විද්‍යුත් වාණිජ්‍යයෙන් වෙනස් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(v) නිෂ්පාදන ආයතනයකට පරිගණක සමෝධානිත නිෂ්පාදන ක්‍රමය (CIM) භාවිතයෙන් ලබාගත හැකි වාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)



CamScanner

## II කොටස

5. මායා සහ චායා විසින් යාපනයේ නිමි ඇඳුම් නිපදවීමේ කර්මාන්තශාලාවක් පිහිටුවන ලදී. ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂිකාව වූ මායා, සේවකයින්ගේ විවිධ හැසිරීම් විධි සහ කාර්යන්ගේ ස්වභාවය අනුව තම නායකත්ව ශෛලිය අනුවර්තනය කර ගනී. මේ අතර කර්මාන්තයේ සාමාන්‍ය පිරිවැය හා සැසඳීමේ දී මෙම ආයතනයේ නිෂ්පාදන පිරිවැය අහස උසට නැග ඇති බැවින් මෙහෙයුම් කළමනාකාරිනි වූ චායා, ඵලදායීතාව වර්ධනය කිරීමට ක්‍රම හා විධි සලකා බලමින් සිටියි.

(i) (අ) මායා අනුගමනය කරන නායකත්ව රටාව නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) කාර්යන්ගේ ස්වභාවයට අනුව නායකයින් ඔවුන්ගේ චර්යාව අනුවර්තනය කර ගත යුත්තේ ඇයි දැයි හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) (අ) මෙම කර්මාන්තශාලාවේ ශ්‍රම ඵලදායිකත්වය වර්ධනය කරගත හැකි ආකාර **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරික තීරණ ගැනීමට මායාට ඇති බලය පිළිබඳ මූලාශ්‍ර **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) නිමි ඇඳුම් නිෂ්පාදනයේ දී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගතවීමෙන් නිෂ්පාදකයකුට ලැබෙන වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදන අපතේ යෑම් අවම කිරීමට තත්ත්ව ආරක්ෂණය උදව් වන්නේ කෙසේ දැයි විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) 'සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදනයේ සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය භාවිත කිරීමෙන් මෙම ව්‍යාපාරයට ලබාගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) මායා සහ චායා ව්‍යාපාරයේ 2025 අගෝස්තු මාසයට අදාළ දත්ත කිහිපයක් පහත වේ.

| | |
|---|---|
| සත්‍ය නිෂ්පාදනය | - ඒකක 17 800 |
| සත්‍ය අමුද්‍රව්‍ය භාවිතය | - කිලෝග්‍රෑම් 10 500 |
| ඒකකයකට සම්මත අමුද්‍රව්‍ය භාවිතය | - කිලෝග්‍රෑම් 0.5 |
| සම්මත අමුද්‍රව්‍ය පිරිවැය | - කිලෝග්‍රෑමයක් සඳහා රු. 4.50 |

අමුද්‍රව්‍ය භාවිත විචලනය ගණනය කර, එවැනි විචලනය සඳහා හේතුවක් දක්වන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

6. ළමා පාවහන් සඳහා වැඩිවන ඉල්ලුම හඳුනාගෙන අමල් පාවහන් නිෂ්පාදන කර්මාන්තශාලාවක් ගාල්ලේ ආරම්භ කරන ලදී. අලෙවිකරණ මිශ්‍රය තීරණය කිරීම සඳහා ඔහු විසින් දෙමාපියන් සහ ළමයින්ගේ රුචිය සහ අපේක්ෂාවන් සමීක්ෂණය කරන ලදී. ඒ අනුව අමල් විසින් 'කිටා' නමින් ආකර්ෂණීය සන්නාමයක් නිර්මාණය කර, ළමයින් සහ දෙමාපියන් ඉලක්ක කරගත් ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වැඩසටහන් දියත් කරන ලදී. පසුගිය වසර හා සැසඳීමේ දී ළමා පාවහන් අලෙවිය දෙගුණයක් වී ඇත. කෙසේ වුවත්, අමල්ට මුදල් ප්‍රවාහ අර්බුදයකට මුහුණ දීමට සිදු වී ඇත.

(i) (අ) අමල් තම නිෂ්පාදන සඳහා යොදාගත් අලෙවිකරණ සංකල්පය සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ප්‍රචාරණය සහ ප්‍රසිද්ධිය අතර ඇති වෙනස කුමක් ද? (ලකුණු 02 යි)

(ii) (අ) හොඳ සන්නාම නාමයක ඇති ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) අමල්ට ළමයින්ගේ පාවහන් වෙළෙඳපොළ ඛණ්ඩනය කිරීම සඳහා භාවිත කළ හැකි පදනම් **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ළමයින් සඳහා පාවහන් නිර්මාණය කිරීමේ දී සලකා බැලිය යුතු නිෂ්පාදනයේ ගුණාංග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'කිටා' සන්නාමය සහිත පාවහන්, නිෂ්පාදන ජීවන චක්‍රයේ (PLC) කුමන අදියරේ ස්ථානගත වී තිබේ ද යන්න හේතුවක් දක්වමින් හඳුන්වා දෙන්න. (ලකුණු 02 යි)

(iv) (අ) ළමා පාවහන් සඳහා මිල තීරණය කිරීමේ දී සලකා බැලිය යුතු සාධක **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) අලෙවිය වර්ධනය වුව ද, අමල්ට මුදල් ප්‍රවාහ අර්බුදයක් ඇති වීමට හේතු විය හැකි කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(v) අමල් ඔහුගේ පෞද්ගලික ඉතුරුම් හෝ බැංකු ණය යොදාගෙන තම ව්‍යාපාරය පුළුල් කිරීමට සැලසුම් කරනු ලබයි. ඔබ ඔහුට කුමන විකල්පය නිර්දේශ කරන්නේ ද? ඔබගේ නිර්දේශිත විකල්පය සඳහා පවතින වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

7. (i) (අ) 'ව්‍යවසායක ප්‍රාග්ධනය (Venture Capital)' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් ප්‍රාථමික සහ ද්විතීයික වෙළෙඳපොළ අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) සමාගමක සංචිත ප්‍රාග්ධනීකරණයේ අරමුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) හිමිකම් මත ප්‍රතිලාභය (ROE) සහ ආයෝජනය මත ප්‍රතිලාභය (ROI) අතර වෙනස්කම කුමක් ද? (ලකුණු 02 යි)

(iii) (අ) 'එක් පුද්ගල සම්මුඛ පරීක්ෂණ (One-on-one interviews)' සහ 'මණ්ඩල සම්මුඛ පරීක්ෂණ (Panel interviews)' අතර ඇති වෙනස්කම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) සේවකයින් සඳහා සංවිධානමය ආතතිය ඇති කරවන සාධක **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) (අ) කාර්යසාධන ඇගයීමෙන් සේවකයකුට හිමිවන ප්‍රතිලාභ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) සේවකයින් බාහිරෙන් බඳවා ගැනීම නිසා අභ්‍යන්තර සේවකයින් මුහුණදෙන සෘණාත්මක බලපෑම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) භාවිතයෙන් මානව සම්පත් කළමනාකරුවන්ට අත්වන ප්‍රතිලාභ **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) පහත දෑ අතුරෙන් **එකක්** විස්තර කරන්න.

1. උපකරණ පදනම් කරගත් අන්තර්ජාලය (Internet of Things - IoT)
2. එක් වරක් භාවිත කළ හැකි මුරපදය (One Time Password - OTP) (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

8. (i) (අ) තොරතුරු තාක්ෂණය මගින් ව්‍යාපාර සන්නිවේදනය වැඩිදියුණු කරගත හැකි ආකාර **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) 'තත්කාලීන දත්ත සැකසුම (Real-time data processing)' සහ 'කාණ්ඩ දත්ත සැකසුම (Batch data processing)' අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ගෙවීම් ද්වාරය (Payment gateway) භාවිත කිරීමෙන් ව්‍යාපාරයක හිමිකරුවන්ට අත්වන වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාර සැලසුමක් සඳහා වෙළෙඳපොළ පර්යේෂණ අවශ්‍ය වන අවස්ථා **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ලිඛිත ව්‍යාපාර සැලසුමක් පැවතීමෙන් සංවිධානයකට අත්වන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) 'නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(iv) (අ) ව්‍යාපාර සැලසුමක් නිර්මාණය කිරීම සඳහා සමාගමේ දැක්ම කෙසේ උදව් වන්නේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදන ක්ෂේත්‍රයේ ව්‍යාපාර සැලසුම් සකස් කිරීමේ දී රටක කුසලතා සහිත ශ්‍රමිකයන් විදේශගතවීම කෙසේ බලපාන්නේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) 'කාරක ප්‍රාග්ධන කළමනාකරණය' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයක කාර්යසාධනය ඇගයීමට භාවිත කරන මූල්‍ය නොවන මිනුම් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

* * *

CamScanner

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2025

| විෂය අංකය<br>பாட இலக்கம் | 32 | විෂයය<br>பாடம் | ව්‍යාපාර අධ්‍යයනය |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 4 | 21. | 2 |
| 02. | 4 | 12. | 3 | 22. | 3 |
| 03. | 5 | 13. | 2 | 23. | 4 |
| 04. | 3 | 14. | 5 | 24. | 3 |
| 05. | 4 | 15. | 1 | 25. | 4 |
| 06. | 2 | 16. | 3 | 26. | 3 |
| 07. | 3 | 17. | 5 | 27. | 4 |
| 08. | 1 | 18. | 4 | 28. | 1 |
| 09. | 4 | 19. | 3 | 29. | 2 |
| 10. | 5 | 20. | 2 | 30. | 2 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 02 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் $2 \times 30 = 60$



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

**31 සිට 50 දක්වා සෑම පිළිතුරකටම ලකුණු ½ බැගින් හිමි වේ.**

31. අ) චුවමනා, අවශ්‍යතා
    ආ) නීතිමය/ නෛතික, අසීමිත

32. අ) 18, 36
    ආ) ලිඛිත, වාචික

33. අ) ශක්‍යතාවය, ප්‍රාග්ධනීකරණය
    ආ) ආයෝජන, මූල්‍ය / මූල්‍ය ගා

34. අ) ආරක්ෂණය, පාලනය / තත්ත්ව හලාය
    ආ) වක්‍රිය කාලය, පමා කාලය/පොරොත්තු කාලය

35. අ) ඉලක්ක, පිහිටුවීම
    ආ) ප්‍රාථමික, ද්විතියික/ ප්‍රවාහන

36. අ) ණය, හිමිකාරිත්වය
    ආ) වෙළෙඳ අගය/ වෙළෙඳ මිල, ප්‍රාග්ධන

37. අ) විස්තාරණය/ රැකියා ප්‍රසාරණය, බලගැන්වීම/රැකියා පෝෂණය
    ආ) අවසන්, ස්වේච්ඡා / ස්ව කැමැත්තෙන්
    (ශා හාර්ම / ඉවත් කිෂ)

38. අ) විධායක, මෙහෙයුම්/ නිෂ්පාදන
    ආ) ප්‍රාදේශීය, පුළුල් LAN / WAN

39. අ) 14001, 50001
    ආ) ආදේශන, දායකත්ව

40. අ) නාමමාත්‍ර, වෙළෙඳ/ වාණිජ
    ආ) අන්තරාල/ ප්‍රති අපනයනය, ප්‍රති නැව්ගත කිරීම

41.
1. තමා ඉතිරි කරගත් මුදල්
2. බැංකු ණය
3. වෙනත් ණය (යාලුවන්ගෙන්)
4. වෙළෙඳ ණය (ණයකරු)
5. දේපළ/අනෙකුත් වත්කම් ඇපයට/උගසට තබා ලබාගත් ණය
6. දේපළ විකුණා ලබාගත් මුදල

42.
1. කෘෂිකාර්මික
2. ධීවර
3. පශු සම්පත්
4. පොල් නිෂ්පාදන
5. තේ නිෂ්පාදන
6. පාසල්
7. විවිධ සේවා

හෝ

1. පාරිභෝගික
2. නිෂ්පාදිත
3. ණය හා සකසුරුවම්
4. විවිධ සේවා

(නමෝම කිමාන් ලකුණු දිය යුතු)

43.
1. ණයවර ලිපි
2. බැංකු අණකර
3. මුදල් අත්තිකාරම්
4. විද්‍යුත් මුදල් ගෙවීම්

44. 1. පිරිවැය අඩුවීම
2. ඕනෑම ස්ථානයකින් පිවිසීමේ හැකියාව
3. පුළුල් කළ හැකි වීම/ ධාරිතාව සීමා නොවීම
4. ආරක්ෂාව
5. විශ්වසනීයත්වය
6. නැවත ලබා ගැනීම
7. කාර්යක්ෂමතාවය
8. සමහර දෘඩාංග හා මෘදුකාංග මිලදී ගැනීමට අවශ්‍ය නොවීම

45. 1. නිෂ්පාදිත
2. කුටි
3. ක්‍රියාවලි
4. ස්ථාවර-ස්ථානීය
5. දෙමුහුන් (Hybrid)

46. 1. සැපයුම්කරු
2. නිෂ්පාදකයන්
3. අතරමැදියන්/ බෙදා හරින්නන්/ නියෝජිතයින්
4. පාරිභෝගිකයන්

47. 1. ලාභ උපරිම කර ගැනීමට
2. සමාජ සුබසාධනයට
3. වෙළෙඳපොළ පුළුල් කර ගැනීමට
4. වෙළෙඳපොළ කොටස වැඩි කර ගැනීමට
5. ව්‍යාපාරයේ ගමන් මග තීරණය කිරීමට
6. ව්‍යාපාර කටයුතු සැලසුම් කර ගැනීමට
7. ව්‍යාපාරයේ සාර්ථකත්වය මැන බැලීමට
8. සීමිත සම්පත් අංශ අතර බෙදා හැරීමට
9. සංවිධාන කටයුතුවල පුද්ගලයන් නිරත කරවීමට

48. 1. බැංකු අංශය
2. තැන්පතු භාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන
3. විශේෂිත මූල්‍ය ආයතන
4. ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන ( මාරු තර කම්පාන් ලෙස නැත් )
හෝ
1. බලපත්‍රලාභි වාණිජ බැංකු
2. බලපත්‍රලාභි විශේෂිත බැංකු
3. බලපත්‍රලාභි මුදල් සමාගම්
4. බලපත්‍රලාභි ක්ෂුද්‍ර මූල්‍ය ආයතන
5. ලියාපදිංචි මූල්‍ය කල්බදු සමාගම්
6. බලයලත් ප්‍රාථමික අලෙවිකරුවන්
7. බලයලත් මුදල් තැරැව්කාර සමාගම්

49. 1. අවස්ථාවක්
2. ශක්තියක්
3. තර්ජනයක්
4. දුර්වලතාවයක්

50. 1. ඇමෙරිකානු ඩොලර්
2. ජපන් යෙන්
3. බ්‍රිතාන්‍ය පවුම
4. ශ්‍රී ලංකා රුපියල්



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

# අ.පො.ස. (උසස් පෙළ) විභාගය - 2025

# 32 - ව්‍යාපාර අධ්‍යයනය

## II පත්‍රය

## I කොටස

**ප්‍රශ්න අංක 01**

1. කර්මාන්තයට නවකයින් වූ ඉංජිනේරුවන් දෙදෙනකු විසින් 'බෙස්ට් ලීව්' හෝටලය ආරම්භ කරන ලදී. මෙහි ගනුදෙනුකරුවන්ට කැපවීමෙන් සේවය කරන අත්දැකීම් හා කුසලතා සහිත, ස්ථිර සහ දෛනික වැටුප් පදනම යටතේ සේවකයන් පනස්දෙනකු සේවයේ නියුක්ත වේ. කෙසේ වෙතත්, දෛනික වැටුප් ලබන සේවකයින්ගේ පිරිවැටුම කර්මාන්තයේ සාමාන්‍ය අගයට වඩා ඉහළ බව අයිතිකරුවන් විසින් නිරීක්ෂණය කර ඇත. හෝටලය නිරතුරුව ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලිකත්වය සුරැකීමට කටයුතු කරන අතර ඔවුන්ට සැමවිට ම ගෞරවාන්විතව සත්කාර කරනු ලබයි. අමුත්තන්ගේ නවාතැන් ස්ථාන පිරිසිදුව තබා ගැනීම, ආරක්ෂාව හා අලංකාරවත් බව තහවුරු කිරීම මෙන්ම ප්‍රණීත, කාබනික හා සෞඛ්‍ය සම්පන්න ආහාර සපයමින් ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂා ඉටු කිරීමට හෝටලය නිරතුරුව ම කටයුතු කරයි. එමෙන්ම රජය විසින් විදෙස් තානාපති කාර්යාල මගින් සහ වෙනත් ප්‍රචාරණ කටයුතු හරහා සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනයට කටයුතු කළ ද ඇතැම් බලපෑම් කළ හැකි කණ්ඩායම් විසින් සංචාරක කර්මාන්තයට විරෝධතාව ප්‍රකාශ කර ඇත.

(i) (අ) බෙස්ට් ලීව් හෝටලය විසින් ඉටු කරනු ලබන ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න.

1. ආහාර
2. නවාතැන්
3. ආරක්ෂාව

(කරුණට 01 x 2 = ලකුණු 02)

(ආ) බෙස්ට් ලීව් හෝටලය විසින් අවධානය යොමු කරන ගනුදෙනුකරුවන්ගේ වුවමනා **දෙකක්** සඳහන් කරන්න.

1. පුද්ගලිකත්වය රැකීම
2. පිරිසිදු සහ අලංකාර පරිසරය
3. සෞඛ්‍ය සම්පන්න/ ප්‍රණීත ආහාර
4. ගෞරවාන්විත සත්කාර

(කරුණට 01 x 2 = ලකුණු 02)

(ii) (අ) බෙස්ට් ලීව් හෝටලයට ආර්ථික සංවර්ධනයට දායක විය හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න.

1. රැකියා අවස්ථා සැපයීම
2. විදේශ විනිමය ඉපයීම
3. රජයේ ආදායමට දායක වීම
4. දේශීය කාබනික ආහාර නිෂ්පාදකයින් සවිබල ගැන්වීම.

(කරුණට 01 x 2 = ලකුණු 02)

(ආ) ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා මෙම හෝටලය භාවිත කරනු ලබන උපායමාර්ග **දෙකක්** හඳුන්වන්න.

1. නවාතැන් ස්ථාන පිරිසිදුව තබා ගැනීම
2. සෞඛ්‍ය සම්පන්න කාබනික ආහාර සැපයීම
3. උසස් සේවා ගුණාත්මකභාවය
4. ගනුදෙනුකරුවන්ට ගෞරවාන්විතව සැලකීම

(කරුණට 01 x 2 = ලකුණු 02)

(iii) (අ) ඉහත සිද්ධියේ සඳහන් වන ඇල්මැති පාර්ශ්වකරුවන් **හතරක්** ලියන්න.

1. හිමිකරුවන් /අයිතිකරුවන්
2. සේවකයන්
3. පාරිභෝගිකයන් /ගනුදෙනුකරුවන්
4. රජය
5. සැපයුම්කරුවන්
6. බලපෑම් කණ්ඩායම්

**(කරුණට ½ x 4 = ලකුණු 02)**

(ආ) ඉහත සිද්ධිය පාදක කරගෙන සංචාරක කර්මාන්තය මුහුණදෙන අවස්ථාවක් සහ තර්ජනයක් හඳුන්වන්න.

- අවස්ථාවන් - රජය තානාපති කාර්යාල හරහා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම
- තර්ජනය - බලපෑම් කණ්ඩායම් එල්ල කරන විරෝධය

**(කරුණට 01 x 2 = ලකුණු 02)**

(iv) බෙස්ට් ලීව් හෝටලයේ දුර්වලතා **දෙකක්** සඳහන් කර, එම එක් එක් දුර්වලතාව තුළින් හෝටලයට ඇතිවන එක් බලපෑම බැගින් කෙටියෙන් පැහැදිලි කරන්න.

1. සේවක පිරිවැටුම වැඩිවීම නිසා නිරතුරු බඳවා ගැනීම හා පුහුණු කිරීමේ වියදම් වැඩිවීමත් සේවා ගුණාත්මක භාවය අඩුවීමත් විය හැකිය.
2. අයිතිකරුවන්ට ක්ෂේත්‍රයේ පළපුරුද්ද අඩුවීම නිසා වැරදි තීරණ ගැනීම මගින් ව්‍යාපාර වර්ධන වේගය අඩුවීම.

**(කරුණු 2ක් නම් කිරීමට ලකුණු 02, පැහැදිලි කිරීමට ලකුණු 02)**

(v) (අ) පරිසර තිරසරභාවය පවත්වා ගැනීමට මෙම හෝටලයට සිදුකළ හැකි මූලික ක්‍රියාකාරකම් **දෙකක්** යෝජනා කරන්න.

1. පරිසර හිතකාමී දෑ මිලට ගැනීම
2. අපද්‍රව්‍ය කළමනාකරණය
3. සූර්ය ශක්තිය වැනි ප්‍රතිජනනීය බල ශක්ති භාවිතය
4. කාබනික ආහාර නිෂ්පාදනය
5. පරිසර නීති රීතිවලට අනුගතව කටයුතු කිරීම

**(කරුණට 01 x 2 = ලකුණු 02)**

(ආ) මෙම හෝටලයට අනුගමනය කළ හැකි ආචාරධර්ම භාවිත **දෙකක්** විස්තර කරන්න.

1. සේවකයින්ට සාධාරණ වැටුප් ගෙවීම
2. පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට සේවා සැපයීම
3. ගනුදෙනුකරුවන් මුලා නොකිරීම හෝ වංචා නොකිරීම
4. සේවකයින්ට යහපත් වැඩ පරිසරයක් ලබාදීම

**(කරුණට 01 x 2 = ලකුණු 02)**

විස්තර කිරීමට 1
තරගානුව 01 1



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍රු/පිළිතුරු පත්‍රු/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

**<u>ප්‍රශ්න අංක 02</u>**

2. අයේෂා සහ රුවිනි සුළු පරිමාණ හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය දේශීය අමුද්‍රව්‍ය භාවිත කර නිපදවූ සාම්ප්‍රදායික අත්කම් භාණ්ඩ අලෙවි කරනු ලබයි. ඔවුන් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ 'නිර්මානී' ලෙස හවුල් ව්‍යාපාරය ලියාපදිංචි කරන ලද අතර අනෙකුත් නීතිමය අවශ්‍යතා සඳහා එය කම්කරු දෙපාර්තමේන්තුවේ ද ලියාපදිංචි කරන ලදී.

(i) (අ) හවුල් ව්‍යාපාර ගිවිසුමක් හවුල් ව්‍යාපාර ඔප්පුවකින් වෙනස් වන්නේ කෙසේ ද?

හවුල් ගිවිසුමක් යනු හවුල් ව්‍යාපාරයක කටයුතු ආරම්භකර පවත්වාගෙන යාම සම්බන්ධයෙන් හවුල්කරුවන් අතර ඇතිකර ගනු ලබන එකඟතාවයි. එය වාචිකව, ලිඛිතව හෝ ව්‍යංගයෙන් ඇතිවිය හැක.

හවුල්කරුවන් අතර ඇති කර ගන්නා ලිඛිත ගිවිසුම හවුල් ඔප්පුව ලෙස හැඳින්වේ.

**(කරුණට 01 x 2 = ලකුණු 02)**

(ආ) හවුල් ව්‍යාපාර ඔප්පුවකින් ව්‍යාපාරයකට අත්වන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.

1. හවුල්කරුවන් අතර මතබේද ආරවුල් බොහෝ දුරට අඩු කර ගත හැක.
2. නෛතික පිළිගැනීමක් අත්වෙයි.
3. හවුල් ව්‍යාපාරයේ කටයුතු පවත්වාගෙන යාමේ දී මගපෙන්වීමක් ඇතිවේ.

**(කරුණට 01 x 2 = ලකුණු 02)**

(ii) (අ) අයේෂා සහ රුවිනි ඔවුන්ගේ හවුල් ව්‍යාපාරය ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කළේ ඇයි දැයි හේතු **දෙකක්** සඳහන් කරන්න.

1. අයිතිකරුවන්ගේ සත්‍ය සම්පූර්ණ නම් වලින් තොරව පවත්වාගෙන යාම.
2. නෛතික අවශ්‍යතාවයක් පැවතීම.

**(කරුණට 01 x 2 = ලකුණු 02)**

(ආ) ඉහත සිද්ධියේ සඳහන් ව්‍යාපාරය කම්කරු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාව කුමක් දැයි පැහැදිලි කරන්න.

සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකත්වය සෑම සේවකයෙකුටම ලබාදීම නීතිමය අවශ්‍යතාවයක් වන හෙයිනි.

**(ලකුණු 02)**

(iii) (අ) සීමිත පෞද්ගලික සමාගමකට සාපේක්ෂව හවුල් ව්‍යාපාරයක පවතින සීමා **දෙකක්** ලියන්න.

1. නෛතික පුද්ගලභාවයන් නොමැති වීම.
2. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
3. විශාල ප්‍රාග්ධනයක් ලබාගත නොහැකි වීම.
4. අසීමිත වගකීම

**(කරුණට 01 x 2 = ලකුණු 02)**

(ආ) ව්‍යාපාර වර්ගීකරණ පදනම් යටතේ නිෂ්පාදනයේ ස්වභාවය අනුව මෙම හවුල් ව්‍යාපාරය අයත් වන්නේ කවර වර්ගයකට දැයි නම් කර, ඊට හේතුවක් දක්වන්න.

තෘතිය අංශයට අයත් වේ හේතුව අත්කම් භාණ්ඩ වෙළඳාම් කිරීම සේවාවක් වන නිසා

**(ලකුණු 02)**

(iv) (අ) දේශීය අමුද්‍රව්‍ය භාවිත කිරීමෙන් ආර්ථිකයට ලබාගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න.

1. විදේශ විනිමය ඉතිරි වීම.
2. දේශයේ ආදායම් මූලාශ්‍ර වැඩිවීම.
3. දේශීය වශයෙන් රැකියා නිර්මාණය වීම.
4. ජාතික නිෂ්පාදන වර්ධනය වීම.
5. පරිසර හිතකාමීත්වය වර්ධනය වීම.
6. දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය වීම.

(කරුණට 01 x 2 = ලකුණු 02)

(ආ) අයේෂා සහ රුවනිට සංචාරකයින් අතර ඔවුන්ගේ ව්‍යාපාරයේ විකුණුම් පරිමාව වැඩි කරගැනීමට යොදාගත හැකි ක්‍රම **දෙකක්** යෝජනා කරන්න.

1. අලෙවි ප්‍රවර්ධන උපක්‍රම භාවිත කිරීම.
2. සේවක පුහුණුව
3. මංගත අලෙවික්‍රම යොදා ගැනීම.
4. සංචාරකයන්ට ගැලපෙන නව මෝස්තර නිර්මාණය කිරීම.
5. සංචාරක නියෝජිතයින් සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.

(කරුණට 01 x 2 = ලකුණු 02)

(v) (අ) මෙම ව්‍යාපාරයට 'නිර්මානී' යන නමින් ජංගම ගිණුමක් ඇරඹිය හැකි ද? ඔබේ පිළිතුරට හේතුවක් දක්වන්න.

පවත්වාගෙන යා හැක.
හේතුව - *ආයතන නීතිමය වශයෙන් ලියාපදිංචි වී ඇති බැවින් ගිණුමක් පවත්වාගෙන යා හැක.*

(ලකුණු 02)

(ආ) චෙක්පතක 'ගනුදෙනු කළ නොහැක' සහ 'ආදායකයාගේ ගිණුමට පමණයි' යන රේඛන අතර ඇති වෙනස දක්වන්න.

- ගනුදෙනු කළ නොහැක. චෙක්පතේ පැවරුම්කරුට හිමි අයිතියට වඩා වැඩියමක් පැවරුම්ලාභියාට හිමි නොවේ. එම චෙක්පත පිටසන් කර පැවරිය හැක.
- ආදායකයාගේ ගිණුමට පමණයි යනු චෙක්පතෙහි සඳහන් ආදායකයාගේ ගිණුමට තැන්පත් කිරීමෙන් පමණක් මුදල් කරගත හැකි බවයි. මේ සීමාකාරී රේඛණයකි.

(කරුණට 01 x 2 = ලකුණු 02)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

**<u>ප්‍රශ්න අංක 03</u>**

**3. (i) (අ) ව්‍යවසායකයා ව්‍යවසායකත්වයෙන් වෙනස් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.**

ව්‍යවසායකයා යනු ව්‍යාපාර අවස්ථා උකහා ගනිමින් ආවදානම් දරමින් නව්‍යතා සම්පාදනය කරන්නෙක් වේ.
ව්‍යවසායකයා නිරත සමස්ත ක්‍රියාවලිය ව්‍යවසායකත්වය ලෙස හැඳින්වෙයි. **(ලකුණු 02)**

**(ආ) ව්‍යවසායකයින්ගේ සාර්ථකත්වය කෙරෙහි තරගකාරිත්වය බලපාන ආකාර දෙකක් පැහැදිලි කරන්න.**

1. දුර්වලතා හඳුනාගෙන ඒවාට සාර්ථකව මුහුණ දීමට කටයුතු කළ හැකිය.
2. තරගකාරී ව්‍යාපාර අභිබවමින් නව්‍යතා සම්පාදනයට යොමු වී නවෝත්පාදන බිහිකළ හැක.
3. පිරිවැය අඩු ක්‍රම පිළිබඳව අත්හදා බලමින් ව්‍යවසායක සාර්ථකත්වය කරා යොමු කළ හැක.
4. වෙළෙඳ ප්‍රවර්ධනය ක්‍රියාකාරකම් සඳහා ඇති අවස්ථා කෙරෙහි යොමුවීම.
5. තරගකාරී ව්‍යාපාර අභිබවා ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීමට යොමු වීම
6. අඛණ්ඩව නිෂ්පාදිත වර්ධනය සඳහා පෙළඹීම.
7. ගුණත්වයෙන් යුතු නිෂ්පාදන බිහිකිරීමට පෙළඹීම.

**(කරුණට 01 x 2 = ලකුණු 02)**

**(ii) (අ) බැංකු මුදල් හා ආසන්න මුදල් අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න.**

| බැංකු මුදල් | ආසන්න මුදල් |
|---|---|
| 1. වාණිජ බැංකුවල ඇති ජංගම ගිණුම් තැන්පතුය. | 1. මුදල් ලෙස පහසුවෙන් පරිවර්තනය කළ හැකි මූල්‍යමය වත්කම්ය. |
| 2. චෙක්පත් හරහා ගෙවීම කළ හැකිවීම. | 2. චෙක්පත් මගින් ගනුදෙනු කළ නොහැක. |
| 3. වටිනාකමේ සන්නිධියක කාර්ය ඉටු නොකරයි. | 3. වටිනාකමේ සන්නිධියක කාර්යය ඉටු කරයි. |
| 4. ද්‍රවශීලතාවය වැඩිය. | 4. ද්‍රවශීලතාවය සාපේක්ෂව අඩුය. |

**වෙනස්කම් දෙකකට ලකුණු 02**
**(වෙනස්කම් වගුගත නොකර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න)**

**(ආ) චෙක්පතක 'සීමාකාරී පිටසන' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?**

වෙනත් කෙනෙකුට පැවරීම සීමා කිරීම සඳහා යොදන පිටසනයි.
උදා:- සමන්ත පෙරේරාට පමණක් ගෙවනු.
**(නිදසුන් ඇතිව හෝ නැතුව පැහැදිලි කිරීමට ලකුණු 02)**



CamScanner

(iii) (අ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (SLC) මගින් ව්‍යාපාරයකට ලබාගත හැකි වාසි **දෙකක්** ලියන්න.

1. විශාල වටිනාකමකින් යුතු වත්කම් මුළු මුදලම නොගෙවා භාවිතයට ඉඩකඩ ලැබීම
2. කල්බදු සඳහා ගෙවන කුලී ආදායම් බද්දෙන් නිදහස් වීම
3. යන්ත්‍ර යල් පැනීම නිසා සිදුවන පාඩු හා ප්‍රාග්ධන අලාභ මගහැරීම
4. විශාල මුදලක් ආයෝජනය නොකර වැඩි ආදායමක් ඉපැයීමේ හැකියාව
5. ආදායම් උපයමින් වාරික වශයෙන් ගෙවීම් කිරීමට හැකිවීම

**(කරුණට 01 x 2 = ලකුණු 02)**

(ආ) ආර්ථිකයක මිල ස්ථායීතාවය ව්‍යාපාරයක් සඳහා වැදගත් වන්නේ ඇයි දැයි හේතු **දෙකක්** දක්වන්න.

1. නිෂ්පාදිතවල මිල නියම කිරීම පහසුවීම
2. ප්‍රවර්ධන කටයුතු පහසුවීම
3. සැලසුම් සකස් කිරීම පහසු වීම
4. වෙළෙඳ පිරිවැටුම වැඩි කර ගැනීම
5. ව්‍යාපාර කටයුතු තහවුරු කර ගැනීම
6. තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකිවීම
7. වෙළඳ ගිවිසුම්වලට එළඹීම පහසුවීම
8. නිෂ්පාදන පිරිවැය පාලනය පහසුවීම
9. අනාගත වියදම් ගණනය කිරීම පහසුවීම
10. පුරෝකතන මගින් නිශ්චිත තීරණ ගැනීමට පහසු වීම

**(කරුණට 01 x 2 = ලකුණු 02)**

(iv) (අ) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමේ (IRCSL) භූමිකාව පැහැදිලි කරන්න.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ අභිවෘද්ධිය ආරක්ෂා කිරීමට සහ රක්ෂණ කර්මාන්තයේ කාර්යක්ෂම මෙහෙයුම් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම

**(ලකුණු 02)**

(ආ) ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් විසින් පිරිනමනු ලබන සාමාන්‍ය රක්ෂණ වර්ග **හතරක්** සඳහන් කරන්න.

1. ගිනි රක්ෂණ
2. සොර බිය රක්ෂණ
3. ස්වභාවික විපත් රක්ෂණ
4. සමුද්‍රීය රක්ෂණ
5. මෝටර් රථ රක්ෂණ
6. වගකීම් රක්ෂණ
7. මාර්ගස්ථ භාණ්ඩ
8. රක්ෂණ මාර්ගස්ථ මුදල් රක්ෂණ

**(කරුණට ½ x 4 = ලකුණු 02)**



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

(v) (අ) ව්‍යාපාරයක් සඳහා සමාජ මාධ්‍ය භාවිතය තුළින් අත්වන අවාසි **දෙකක්** විස්තර කරන්න.

1. ව්‍යාපාරයකට අනවශ්‍ය ව්‍යාජ විවේචන එල්ලවීම
2. කීර්තිනාමයට හානි සිදුවීම
3. ව්‍යාපාරයට අහිතකර තොරතුරු සීඝ්‍ර ලෙස ප්‍රචාරනය වීම
4. නීතිමය අවදානම
5. ගනුදෙනුකරුවන් සමග ඍජු සම්බන්ධතා පවත්වා ගැනීමට නොහැකි වීම .
6. ගනුදෙනුකරුවන්ගේ ප්‍රතික්‍රියා පාලනය කිරීමේ අපහසුව
7. ආරක්ෂිව හා පුද්ගලිකත්වය අවදානම

**(කරුණට 01 x 2 = ලකුණු 02)**

(ආ) අතරමැදිකරණයෙන් තොර විද්‍යුත් වාණිජ්‍යය නිසා පාරිභෝගිකයකුට අත්වන වාසි **දෙකක්** පැහැදිලි කරන්න.

1. පාරිභෝගිකයන්ගේ කාලය හා ශ්‍රමය ඉතිරි වීම
2. පහසුවෙන් හා ඉක්මනින් ඇනවුම් කළ හැකි වීම
3. මිල මට්ටම් සාපේක්ෂව අඩු වීම
4. පුළුල් තෝරාගැනීමකට ඉඩකඩ සැලසීම
5. සැපයුම්කරු සමග ඍජු සම්බන්ධතාවයක් පවත්වා ගත හැකි වීම

**(කරුණට 01 x 2 = ලකුණු 02)**

**<u>ප්‍රශ්න අංක 04</u>**

**4.** (i) (අ) ක්‍රම කාර්ය සම්පාදනයේ දී ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීමෙන් ව්‍යාපාරයකට අත්වන වාසි **දෙකක්** ලියන්න.

1. පිරිවැය අවම වීම
2. නිරවද්‍යතාව ඉහල වීම
3. ඵලදායීතාව ඉහල වීම
4. කාලය ඉතිරිවීම
5. සමස්ත සැපයුම් සේවා පද්ධතිය සුමටව ගලා යෑම
6. අවශ්‍ය අවස්ථාවේදී නිරීක්ෂණය කළ හැකි වීම
7. තොග පාලනය පහසු වීම

**(01 x 2 = ලකුණු 02)**

(ආ) පාරිභෝගිකයා වෙත ඇතැම් නිෂ්පාදන ඉක්මනින් සහ වේගවත්ව බෙදාහැරීම සිදුකළ යුතු අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

1. ඉක්මනින් නශ්‍ය වන ද්‍රව්‍ය බෙදා හැරීමේ දී
2. හදිසි ලිපි ලේඛන බෙදා හැරීම
3. හදිසි ඖෂධ බෙදා හැරීම
4. විශේෂ අවස්ථාවල බෙදා හැරිය යුතු භාණ්ඩ බෙදා හැරීමේ දී

**(01 x 2 = ලකුණු 02)**



CamScanner

(ii) (අ) ස්වයංක්‍රිය ගබඩා පද්ධතියකින් ව්‍යාපාරයකට ඇති ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න.

1. පිරිවැය අවම වීම (සේවක පිරිවැය)
2. ගබඩා ක්‍රියාවලිය ක්‍රමවත් හා කාර්යක්ෂම වීම
3. අපතය හා නාස්තිය අවම වීම
4. තොග පාලනය පහසු වීම
5. ද්‍රව්‍ය නිකුත් කිරීම හා ගබඩා කිරීම පහසු වීම
6. අවශ්‍ය ඕනෑම විටක ගබඩාවේ ඇති තොග සම්බන්ධ තොරතුරු පහසුවෙන් ලබා ගත හැකිවීම

**(½ x 4 = ලකුණු 02)**

(ආ) 'කොමිස් නියෝජිතයා' සහ 'තැරැව්කරු' අතර ඇති වෙනස හඳුන්වා දෙන්න.

| කොමිස් නියෝජිතයා | තැරැව්කරු |
|---|---|
| 1. ප්‍රධානියාට වාසිදායක වන ලෙස තම අභිමතය පරිදි ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලට ගැනීම හෝ විකිණීම කරනු ලබයි.<br>2. කොමිස් මුදලක් අයකර ගනී.<br>3. භාණ්ඩවල අයිතිය ඇත. | 1. ගනුදෙනුවකට අදාළ පාර්ශව සම්මුඛ කරමින් හා අවශ්‍ය තොරතුරු සපයයි.<br>2. ඇතැම්විට ගනුදෙනුකරුවන්ගෙන් ද, ඇතැම්විට විකුණුම්කරුවන්ගෙන් ද, ඇතැම්විට දෙපාර්ශවයෙන්ම ගාස්තු අයකරයි. (එය තැරැව් ගාස්තුවකි.)<br>3. භාණ්ඩවල අයිතිය නැත. |

**(01 x 2 = ලකුණු 02)**

(iii) (අ) ප්‍රවාහනයේ දී බහලුම්ගතකරණය මගින් ආනයනකරුට අත්වන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න.

- භාණ්ඩවලට ආරක්ෂාවක් ලැබීම(සොරකම් කිරීම් මගින්)
- භාණ්ඩවල ස්වභාවය අනුව බහාලුම් තෝරා ගත හැකි වීම.
- මෙහෙයුම් ක්‍රියාවලිය කාර්යක්ෂම වීම.
- තම භාණ්ඩ වෙන්කර හඳුනා ගැනීම පහසු වීම.
- ප්‍රවාහන පිරිවැය අවම වීම.

**(01 x 2 = ලකුණු 02)**

(ආ) නැව තෙක් නොමිලේ (FOB) සහ පිරිවැය, රක්ෂණ සහ ගැල්කුලිය (CIF) යන මිල කිරීම් අතර ඇති වෙනස්කම කුමක් ද?

<u>නැව තෙක් නොමිලේ (FOB)</u>

නැවට පටවන තෙක් සියලු වියදම් ඇතුළත් කර භාණ්ඩ මිල කිරීම FOB ලෙස හැඳින්වේ.

<u>මිල, රක්ෂණය, ගැල් කුලිය (CIF)</u>

ආනයනය කරන වරාය තෙක් ගෙන යාමට අදාල ගාස්තු (රක්ෂණය, ගැල් කුලිය) ඇතුළත් කර සිදු කරන මිල කිරීම CIF වේ.

**(වෙනස දැක්වීමට 01 x 2 = ලකුණු 02)**



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

(iv) (අ) ජාත්‍යන්තර වෙළෙඳාමේ දී භාවිත වන ප්‍රභවස්ථාන සහතිකයේ අරමුණු **දෙකක්** ලියන්න.

1. තීරු බදු සහන ලබා ගැනීම හෝ නිදහස් කර ගැනීම
2. අදාල රටේම නිපදවූ බව තහවුරු කිරීම.
3. අනීතික වෙළෙදාම් නතර කිරීම.
4. වෙළෙදාම සම්බන්ධ පාර්ශවයන් අතර විශ්වාසය ගොඩනැගීම.
5. ජාත්‍යන්තර වෙළෙද නිතිරීති වලට අනුගත වීම

**(අරමුණු 02කට 01 x 2 = ලකුණු 02)**

**(ආ) විද්‍යුත් ව්‍යාපාර, විද්‍යුත් වාණිජ්‍යයෙන් වෙනස් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.**

විද්‍යුත් ව්‍යාපාර යනු සියලු ව්‍යාපාර කටයුතු විද්‍යුත් ක්‍රමයට අන්තර්ජාලය හරහා සිදු කිරීමයි. මෙහිදී මිළට ගැනීම, විකිණීම මෙන්ම සියලු උපකාරක සේවා ද පමණක් නොව නිෂ්පාදනය, අළෙවිය හා බෙදා හැරීම ආදී සියලු ව්‍යාපාර කාර්යයන් ද විද්‍යුත් ක්‍රමයට සිදු කිරීමයි.

විද්‍යුත් වාණිජ්‍යයේදී සිදුකරනු ලබන්නේ මංගත ක්‍රමයට මිලට ගැනීම, විකිණීම සහ ගෙවීමත් සියලු උපකාරක සේවාවන් ද විද්‍යුත් ක්‍රමයට සිදු කිරීමයි. මෙය විද්‍යුත් ව්‍යාපාරවල උප කොටසයි.

**(වෙනස දැක්වීමට 01 x 2 = ලකුණු 02)**

(v) **නිෂ්පාදන ආයතනයකට පරිගණක සමෝධානිත නිෂ්පාදන ක්‍රමය (CIM) භාවිතයෙන් ලබාගත හැකි වාසි හතරක් සඳහන් කරන්න.**

1. එක් පුද්ගලයෙකුට වුවද සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය නියාමනය කළ හැකි වීම.
2. පරිගණකය නිරීක්ෂණය කිරීම මගින් හඳුනාගන්න අපගමනයන් පරිගණක විධානයක් මගින් නිවැරදි කළ හැකි වීම.
3. නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම වීම.
4. ඵලදායිතාවය ඉහළ යාම.
5. සේවක පිරිවැය අඩු වීම.
6. වේගවත්ව නිෂ්පාදනය කළ හැකි වීම.
7. සම්බන්ධීකරණය පහසු වීම.

**(වාසි 4කට 01 x 4 = ලකුණු 04)**



CS CamScanner

## II කොටස

**ප්‍රශ්න අංක 05**

**5.** මායා සහ චායා විසින් යාපනයේ නිමි ඇඳුම් නිපදවීමේ කර්මාන්තශාලාවක් පිහිටුවන ලදී. ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂිකාව වූ මායා, සේවකයින්ගේ විවිධ හැසිරීම් විධි සහ කාර්යන්ගේ ස්වභාවය අනුව තම නායකත්ව ශෛලිය අනුවර්තනය කර ගනී. මේ අතර කර්මාන්තයේ සාමාන්‍ය පිරිවැය හා සැසඳීමේ දී මෙම ආයතනයේ නිෂ්පාදන පිරිවැය අහස උසට නැඟ ඇති බැවින් මෙහෙයුම් කළමනාකාරිනි වූ චායා, ඵලදායීතාව වර්ධනය කිරීමට ක්‍රම හා විධි සලකා බලමින් සිටියි.

(i) (අ) මායා අනුගමනය කරන නායකත්ව රටාව නම් කරන්න.

අවස්ථානුකූල නායකත්වය

(ලකුණු 02)

(ආ) කාර්යන්ගේ ස්වභාවයට අනුව නායකයින් ඔවුන්ගේ චර්යාව අනුවර්තනය කර ගත යුත්තේ ඇයි දැයි හේතු **දෙකක්** ලියන්න.

1. කාර්යයේ සංකීර්ණත්වය මත
2. සේවකයගේ කුසලතා මට්ටම අනුව
3. සේවකයන්ගේ අභිප්‍රේරණ මට්ටම මත
4. අවස්ථාවන් වෙනස් වීම මත

**(01 x 2 = ලකුණු 02)**

(ii) (අ) මෙම කර්මාන්තශාලාවේ ශ්‍රම ඵලදායිකත්වය වර්ධනය කරගත හැකි ආකාර **දෙකක්** යෝජනා කරන්න.

1. පුහුණු සේවකයින් යොදා ගැනීම
2. සේවකයින් පුහුණු කිරීම
3. මූල්‍ය හා මූල්‍ය නොවන අභිප්‍රේරණ ක්‍රම යොදා ගැනීම
4. තත්ත්ව කව යොදා ගැනීම
5. මනා සේවක සම්බන්ධතා යොදා ගැනීම
6. කාර්ය සාදන ඇගයීම

**(01 x 2 = ලකුණු 02)**

(ආ) ව්‍යාපාරික තීරණ ගැනීමට මායාට ඇති බලය පිළිබඳ මූලාශ්‍ර **හතරක්** සඳහන් කරන්න.

1. නීත්‍යානුකූලව තනතුරට අදාළ බලය (අධිකාරී බලය)
2. ත්‍යාග දීමේ බලය
3. බලපෑම් කිරීමේ බලය / දඬුවම් දීමේ බලය
4. විශේෂඥ බලය
5. සම්බන්ධතා බලය
6. තොරතුරු බලය

½ × 4

**(01 x 2 = ලකුණු 02)**

(iii) (අ) නිමි ඇඳුම් නිෂ්පාදනයේ දී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගතවීමෙන් නිෂ්පාදකයකුට ලැබෙන වාසි **දෙකක්** ලියන්න.

1. වෙළෙඳපොළට පහසුවෙන් ප්‍රවේශ විය හැකි වීම
2. වෙළෙඳපොළ තරගකාරීත්වයට පහසුවෙන් මුහුණදිය හැකි වීම
3. ලාභදායීත්වය වර්ධනය වී ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම.
4. පාරිභෝගික ආරක්ෂනය ලැබීම
5. නෛතික ගැටලු අවම වීම.

**(01 x 2 = ලකුණු 02)**



CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ආ) **නිෂ්පාදන අපතේ යෑම් අවම කිරීමට තත්ත්ව ආරක්ෂණය උදව් වන්නේ කෙසේ දැයි විස්තර කරන්න.**

නිෂ්පාදිත ක්‍රියාවලිය දිගින් දිගටම පරීක්ෂා කිරීම හේතුවෙන් නිෂ්පාදිතයන්හි දෝෂ අවම කළ හැකි වීමත් දුර්වලතා එම අවස්ථාවලදීම නිවැරදි කළ හැකි වීමත් නිසා ව්‍යාපාරයේ අපතය අඩු කළ හැකි වීම.

**(ලකුණු 02)**

(iv) (අ) **'සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?**

නිෂ්පාදන් ක්‍රියාවලියේ කාර්යය සාධනය පිළිබඳව දත්ත රැස්කර ඒවා රූපසටහන් වගු හා ප්‍රස්ථාර මඟින් අදාල පාර්ශව වෙත විශ්ලේෂණය කර සන්නිවේදනය කිරීම

**(ලකුණු 02)**

(ආ) **නිෂ්පාදනයේ සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය භාවිත කිරීමෙන් මෙම ව්‍යාපාරයට ලබාගත හැකි වාසි දෙකක් සඳහන් කරන්න.**

1. අපතේ යෑම අඩු වීම.
2. පිරිවැය පාලනය වීම
3. කාර්යක්ෂමතාවය වර්ධනය වීම
4. නිෂ්පාදන වෙනස්වීම් සම්බන්ධ ගැටලු ඇති වීමට පෙර හඳුනාගත හැකි වීම
5. ඒකාකාරීව නිෂ්පාදනය පවත්වාගත හැකිවීම.

**(01 x 2 = ලකුණු 02)**

(v) **මායා සහ චායා ව්‍යාපාරයේ 2025 අගෝස්තු මාසයට අදාළ දත්ත කිහිපයක් පහත වේ.**

| | |
|---|---|
| **සත්‍ය නිෂ්පාදනය** | **- ඒකක 17 800** |
| **සත්‍ය අමුද්‍රව්‍ය භාවිතය** | **- කිලෝග්‍රෑම් 10 500** |
| **ඒකකයකට සම්මත අමුද්‍රව්‍ය භාවිතය** | **- කිලෝග්‍රෑම් 0.5** |
| **සම්මත අමුද්‍රව්‍ය පිරිවැය** | **- කිලෝග්‍රෑමයක් සඳහා රු. 4.50** |

**අමුද්‍රව්‍ය භාවිත විචලනය ගණනය කර, එවැනි විචලනය සඳහා හේතුවක් දක්වන්න.**

$17800 \times \frac{1}{2} = \frac{8900}{1600}$

ඒකක $= (1600)$ (අවාසිදායක)

$1600 \times 4.50 = $ (රු. 7200) (අවාසිදායක)

**පිළිතුරට ඍණ හෝ ධන නොමැතිව 1600 ඇතිනම් ලකුණු 01**
**පිළිතුරට ඍණ හා අවාසි යන්න යොදා ඇතිනම් ලකුණු 01**

හේතු :-
1. යන්ත්‍රසූත්‍ර අබළන් වීම හා සේවක ගැටලු
2. නිෂ්පාදන ක්‍රියාවලිය නිසි පාලනයට යටත් නොවීම.
3. ගුණාත්මක අමුද්‍රව්‍ය භාවිත නොකිරීම.
4. අපතය හා නාස්තිය වැඩි වීම.

**(ලකුණු 02)**

**ප්‍රශ්න අංක 06**

**6.** ළමා පාවහන් සඳහා වැඩිවන ඉල්ලුම හඳුනාගෙන අමල් පාවහන් නිෂ්පාදන කර්මාන්තශාලාවක් ගාල්ලේ ආරම්භ කරන ලදී. අලෙවිකරණ මිශ්‍රය තීරණය කිරීම සඳහා ඔහු විසින් දෙමාපියන් සහ ළමයින්ගේ රුචිය සහ අපේක්ෂාවන් සමීක්ෂණය කරන ලදී. ඒ අනුව අමල් විසින් 'කිටා' නමින් ආකර්ෂණීය සන්නාමයක් නිර්මාණය කර, ළමයින් සහ දෙමාපියන් ඉලක්ක කරගත් ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වැඩසටහන් දියත් කරන ලදී. පසුගිය වසර හා සැසඳීමේ දී ළමා පාවහන් අලෙවිය දෙගුණයක් වී ඇත. කෙසේ වුවත්, අමල්ට මුදල් ප්‍රවාහ අර්බුදයකට මුහුණ දීමට සිදු වී ඇත.

(i) (අ) අමල් තම නිෂ්පාදන සඳහා යොදාගත් අලෙවිකරණ සංකල්පය සඳහන් කරන්න.

අලෙවිකරණ සංකල්පය

**(ලකුණු 02)**

(ආ) ප්‍රචාරණය සහ ප්‍රසිද්ධිය අතර ඇති වෙනස කුමක් ද?

පිරිවැයක් දරා ආයතනික පාලනයක් ඇතිව සිදු කරන සන්නිවේදනය ප්‍රචාරණය වන අතර පිරිවැයක් නොදරා ආයතනයක් පාලනයකින් තොරව සිදු කරන සන්නිවේදනය ප්‍රසිද්ධිය නම් වේ.

**(ලකුණු 02)**

(ii) (අ) හොඳ සන්නාම නාමයක ඇති ලක්ෂණ **දෙකක්** ලියන්න.

1. කෙටි හා සරළ වීම
2. උච්ඡාරණය හඳුනා ගැනීම හා මතක තබා ගැනීම පහසු වීම
3. නිෂ්පාදිතයක් මූලික ගුණාංග හා ප්‍රයෝජන පිළිබඳව අදහසක් ඇඟවීම.
4. පහසුවෙන් වෙනත් භාෂාවකට පරිවර්තනය කළ හැකි වීම.
5. තරඟකරුවන්ගේ සන්නම් වලට වඩා වෙනස් වීම.
6. කිසියම් සංස්කෘතියක් නියෝජනය වීම

**(01 x 2 = ලකුණු 02)**

(ආ) අමල්ට ළමයින්ගේ පාවහන් වෙළෙඳපොළ ඛණ්ඩනය කිරීම සඳහා භාවිත කළ හැකි පදනම් **දෙකක්** යෝජනා කරන්න.

1. ප්‍රජාවිද්‍යාත්මක
2. භූගෝලීය
3. මනෝවිද්‍යාත්මක
4. චර්යාත්මක

**(01 x 2 = ලකුණු 02)**

(iii) (අ) ළමයින් සඳහා පාවහන් නිර්මාණය කිරීමේ දී සලකා බැලිය යුතු නිෂ්පාදනයේ ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

1. අහිතකර රසායනික ද්‍රව්‍ය අඩංගු නොවීම / අහිතකර ද්‍රව්‍ය අඩංගු නොවීම
2. ආරක්ෂාව
3. පහසුව
4. ආකර්ෂණීයත්වය
5. මිල විවිධත්වය

**(01 x 2 = ලකුණු 02)**



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

(ආ) 'කිටා' සන්නාමය සහිත පාවහන්, නිෂ්පාදන ජීවන චක්‍රයේ (PLC) කුමන අදියරේ ස්ථානගත වී තිබේ ද යන්න හේතුවක් දක්වමින් හඳුන්වා දෙන්න.

වර්ධන අදියර (ලකුණු 01)
හේතුව :- අලෙවිය වර්ධනය වෙමින් පැවැතීම. (ලකුණු 01)

(iv) (අ) ළමා පාවහන් සඳහා මිල තීරණය කිරීමේ දී සලකා බැලිය යුතු සාධක **දෙකක්** සඳහන් කරන්න.

1. නිෂ්පාදන පිරිවැය
2. පාරිභෝගික ඉල්ලුම
3. තරඟකරුවන්ගේ මිල ගණන්
4. ලාභාන්තිකය
5. සන්නම
6. විකුණන ස්ථානය

(01 x 2 = ලකුණු 02)

(ආ) අලෙවිය වර්ධනය වුව ද, අමල්ට මුදල් ප්‍රවාහ අර්බුදයක් ඇති වීමට හේතු විය හැකි කරුණු **දෙකක්** ලියන්න.

1. නිෂ්පාදන පිරිවැය වැඩි වීම
2. අලෙවිකරණ පිරිවැය වැඩි වීම
3. මිළ කිරීමේ දුර්වලතා
4. ණයගැති කාලය දීර්ඝ වීම
5. තොග පාලනයේ ගැටලු

(01 x 2 = ලකුණු 02)

(v) අමල් ඔහුගේ පෞද්ගලික ඉතුරුම් හෝ බැංකු ණය යොදාගෙන තම ව්‍යාපාරය පුළුල් කිරීමට සැලසුම් කරනු ලබයි. ඔබ ඔහුට කුමන විකල්පය නිර්දේශ කරන්නේ ද? ඔබගේ නිර්දේශිත විකල්පය සඳහා පවතින වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** දක්වන්න.

**පෞද්ගලික ඉතුරුම්**

වාසි :-
1. පිරිවැය අඩු වීම
2. මූල්‍ය බැඳීම් අඩු වීම
3. හිමිකාරීත්වය ආරක්ෂා වීම
4. පහසුවෙන් ලබා ගත හැකි වීම
5. අවදානම අඩු වීම

අවාසි :-
1. විශාල ප්‍රාග්ධනයක් ලබා ගැනීම අපහසු වීම
2. තම මුදල් අවදානමකට ලක් කිරීම
3. බදු ප්‍රතිලාභ අහිමි වීම

**බැංකු ණය**

වාසි :-
1. විශාල ණය මුදලක් ලබා ගත හැකි වීම
2. බදු ප්‍රතිලාභ හිමි වීම
3. තම මුදල් වැඩි ප්‍රතිලාභ සහිත ආයෝජනවල යෙදවීම
4. ව්‍යාපාට හිමිකාරීත්වය තමාසතු කර ගත හැකි වීම

අවාසි :-
1. පොළිය ගෙවීමට සිදුවීම
2. ණය බැඳීමක් ඇති වීම
3. මූල්‍ය අවදානමක් ඇති වීම

(වාසි 02කට 01 x 2 = ලකුණු 02 , අවාසි 02කට 01 x 2 = ලකුණු)

**ප්‍රශ්න අංක 07**

7. (i) (අ) 'ව්‍යවසායක ප්‍රාග්ධනය (Venture Capital)' යනු කුමක් ද?

ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම් විසින් නව ව්‍යවසාය ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අවස්ථාවේදී සපයනු ලබන ප්‍රාග්ධනයයි.

(ලකුණු 02)

(ආ) භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් ප්‍රාථමික සහ ද්විතීයික වෙළෙඳපොළ අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාථමික අලෙවිකරුවන්ට භාණ්ඩාගාර බිල්පත් අලෙවි කිරීම භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළෙඳපොළයි.

ප්‍රාථමික වෙළෙඳපළෙන් මිළට ගත් භාණ්ඩාගාර බිල්පත් කල්පිරන තෙක් ළඟ තබා නොගෙන භාණ්ඩාගාර බිල්පත් විකිණීම හා මිළදී ගැනීම සිදුවන වෙළඳපළ ද්විතීක භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළයි.

(ලකුණු 02)

(ii) (අ) සමාගමක සංචිත ප්‍රාග්ධනීකරණයේ අරමුණු **දෙකක්** ලියන්න.

1. ප්‍රාග්ධන ව්‍යුහය ශක්තිමත් කිරීම.
2. අයිතිකරුවන් දිරිගැන්වීම.
   උදා:- ප්‍රසාද කොටස්
3. හිමිකාරීත්වය පුළුල් නොකිරීම .
4. අභ්‍යන්තර අරමුදල් සම්පාදනයේ මාර්ගයක් බවට පත් කර ගත හැකි වීම.

(01 x 2 = ලකුණු 02)

(ආ) හිමිකම් මත ප්‍රතිලාභය (ROE) සහ ආයෝජනය මත ප්‍රතිලාභය (ROI) අතර වෙනස්කම කුමක් ද?

හිමිකම් ප්‍රාග්ධනයට සාපේක්ෂව ලැබෙන ප්‍රතිලාභය ගණනය කිරීම හිමිකම් මත ප්‍රතිලාභය වන අතර, සමස්ත ආයෝජනය මත උපයන ප්‍රතිලාභය ගණනය කිරීම ආයෝජනය මත ප්‍රතිලාභය නම් වෙයි.

(ගණනය කිරීම ප්‍රමාණවත් නෑ)

(ලකුණු 02)

(iii) (අ) 'එක් පුද්ගල සම්මුඛ පරීක්ෂණ (One-on-one interviews)' සහ 'මණ්ඩල සම්මුඛ පරීක්ෂණ (Panel interviews)' අතර ඇති වෙනස්කම් **දෙකක්** පැහැදිලි කරන්න.

| ඒක පුද්ගල සම්මුඛ පරීක්ෂණයන් | මණ්ඩල සම්මුඛ පරීක්ෂණයන් |
|---|---|
| 1. ඒක පුද්ගල සම්මුඛ පරීක්ෂකවරයෙකි | 1. සම්මුඛ පරීක්ෂකවරු කිහිප දෙනෙකි |
| 2. එක් පුද්ගලයෙක් විසින් තීරණ ගන්නා බැවින් තීරණ පක්ෂපාති විය හැක | 2. තීරණ පක්ෂපාතී නොවීම |
| 3. පටු පරාසයක පරීක්ෂණයකි | 3. පුළුල් පරාසයක පරීක්ෂණයකි |
| 4. විවිධිමත්භාවය අඩුයි | 4. විධිමත්භාවය වැඩි |

(01 x 2 = ලකුණු 02)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

(ආ) සේවකයින් සඳහා සංවිධානමය ආතතිය ඇති කරවන සාධක **දෙකක්** ලියන්න.

1. අධික වැඩ ධාරිතාව
2. ළඟා කරගත නොහැකි ඉලක්ක ලබා දීම
3. රැකියා ස්ථානය හා කාලය වෙනස් වීම
4. දුර්වල සන්නිවේදනය
5. කළමනාකරණ සහයෝගය අඩු වීම

**(01 x 2 = ලකුණු 02)**

(iv) (අ) කාර්යසාධන ඇගයීමෙන් සේවකයකුට හිමිවන ප්‍රතිලාභ **දෙකක්** විස්තර කරන්න.

1. සේවක අභිප්‍රේරණය වර්ධනය වීම
2. සේවක ඇගැයීමෙන් ලැබෙන ප්‍රතිලාභ
3. අනාගත උසස් වීම් සඳහා සුදුසුකම් ලැබීමට හැකි වීම
4. තම ඉපයීම ඉහළ නංවා ගැනීමට හැකි වීම
5. පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට හැකි වීම
6. රැකියා තෘප්තිය වැඩි වීම
7. හැකියාවන් හඳුනාගත හැකි වීම
8. වර්ධනය කර ගත යුතු දෑ පෙන්නුම් කිරීම

**(01 x 2 = ලකුණු 02)**

(ආ) සේවකයින් බාහිරෙන් බඳවා ගැනීම නිසා අභ්‍යන්තර සේවකයින් මුහුණදෙන සෘණාත්මක බලපෑම් **දෙකක්** පැහැදිලි කරන්න.

1. සේවක අභිප්‍රේරණයට බාධා ඇති වීම
2. උසස් වීම් අවස්ථා අවම වීම
3. සිටින සේවකයන් හා නව සේවකයින් අතර ගැටලු ඇති වීම
4. පිරිවැටුම වැඩි වීම
5. අසාධාරණ හෝ පක්ෂග්‍රාහීවීමේ හැඟීම

**(01 x 2 = ලකුණු 02)**

(v) (අ) මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) භාවිතයෙන් මානව සම්පත් කළමනාකරුවන්ට අත්වන ප්‍රතිලාභ **දෙකක්** දක්වන්න.

1. මානව සම්පත් සැලසුම් කරනය කාර්ය පහසු වීම
2. සේවක කළමනාකරණය කාර්ය කාර්යක්ෂම වීම
3. සේවකයින් සම්බන්ධ තීරණ ගැනීම පහසු වීම
4. මානව සම්පත් පුරෝකතනයේ පහසු වීම

**(01 x 2 = ලකුණු 02)**

(ආ) පහත දෑ අතුරෙන් **එකක්** විස්තර කරන්න.
1. උපකරණ පදනම් කරගත් අන්තර්ජාලය (Internet of Things - IoT)
2. එක් වරක් භාවිත කළ හැකි මුරපදය (One Time Password - OTP)

1. උපකරණ පදම් කරගත් අන්තර්ජාල - IoT
විවිධ තාක්ෂණික උපාංග ජාලගත කොට ස්වයංක්‍රීයව සන්නිවේදනය සිදු කිරීම

හෝ

2. එක් වරක් භාවිත කළ හැකි මුර පදය - OTP
භාවිත කරන්නා තහවුරු කර ගැනීම සඳහා එක් වතාවක් පමණක් භාවිත කළ හැකි ආරක්ෂිත කේතය

**(ලකුණු 02)**



PAST PAPERS WIKI

**ප්‍රශ්න අංක 08**

8. (i) (අ) තොරතුරු තාක්ෂණය මගින් ව්‍යාපාර සන්නිවේදනය වැඩිදියුණු කරගත හැකි ආකාර **හතරක්** දක්වන්න.

1. විද්‍යුත් තැපැල් සහ ක්ෂණික පණිවුඩ සේවාව හරහා
2. වීඩියෝ සම්මන්ත්‍රණ සඳහා භාවිතය
3. සමාගම් සතු වෙබ් අඩවි මගින්
4. විද්‍යුත් ක්‍රම මගින් ලිපිගොනු හුවමාරුව
5. අභ්‍යන්තර හා බාහිර ජාලයන් භාවිතය
6. මංගත ක්‍රමයට සහයෝගීව වැඩ කළ හැකි වීම (Tele පරිගණක කටයුතු)

**(½ x 4 = ලකුණු 02)**

(ආ) 'තත්කාලීන දත්ත සැකසුම (Real-time data processing)' සහ 'කාණ්ඩ දත්ත සැකසුම (Batch data processing)' අතර වෙනස පැහැදිලි කරන්න.

දත්ත ලැබෙන අවස්ථාවේදීම ඒවා සකස් කිරීම **තත්කාලීන දත්ත සැකසුම** වන අතර **කාණ්ඩ දත්ත සැකසුම** යනු කිසියම් නිශ්චිත කාල පරාසයක් තුළදී දත්ත කාණ්ඩ වශයෙන් සැකසීමයි.

**(ලකුණු 02)**

(ii) (අ) ගෙවීම් ද්වාරය (Payment gateway) භාවිත කිරීමෙන් ව්‍යාපාරයක හිමිකරුවන්ට අත්වන වාසි **දෙකක්** සඳහන් කරන්න.

1. ආරක්ෂිතව ගනුදෙනු කළ හැකි වීම.
2. පහසුවෙන් ගනුදෙනු කළ හැකි වීම.
3. ගනුදෙනුවල නිරවද්‍යතාව ඉහළ වීම.
4. ගනුදෙනු ආශ්‍රිත පිරිවැය අඩු වීම.
5. ගෝලීය වශයෙන් ගනුදෙනු කළ හැකි වීම.

**(01 x 2 = ලකුණු 02)**

(ආ) ව්‍යාපාර සැලසුමක් සඳහා වෙළෙඳපොළ පර්යේෂණ අවශ්‍ය වන අවස්ථා **දෙකක්** යෝජනා කරන්න.

1. නව ව්‍යාපාරයක් ඇරඹීමේ දී
2. නව නිෂ්පාදිතයන් හඳුන්වාදීමේ දී
3. නව වෙළෙඳපොළකට ප්‍රවිශ්ය වීමේ දී
4. ඉලක්ක ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමේ දී
5. තරගකරුවන් හඳුනාගැනීමේ දී
6. මිල තීරණය කිරීමේ දී
7. නව ප්‍රවර්ධන උපක්‍රම තෝරා ගැනීමේ දී
8. පවත්නා නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ දී

**(01 x 2 = ලකුණු 02)**

(iii) (අ) ලිඛිත ව්‍යාපාර සැලසුමක් පැවතීමෙන් සංවිධානයකට අත්වන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න.

1. ව්‍යායාපාරයක් මෙහෙයුම් කටයුතු සඳහා මඟ පෙන්වීම.
2. ව්‍යාපාරයට මුදල් ලබා ගැනීමේදී මූල්‍ය ආයතනය සඳහා ඉදිරිපත් කළ හැකි වීම.
3. ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සාර්ථකත්වය මැන බැලීමට(කාර්ය සාධනය මැන බැලීමට).
4. ඇල්මැති පාර්ශ්වයන්ට ව්‍යාපාරය පිළිබඳ අවබෝධයක් ලබා දීමට.
5. ව්‍යාපාරය අනාගතයේදී යා යුතු ස්ථානය පෙන්නුම් කිරීම.
6. ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් හඳුනා ගැනීමට හා ඒවා නිසි ලෙස හසුරුවාලීමට.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

7. ව්‍යාපාරයේ තනතුරු සඳහා සේවකයන් ආකර්ෂණය කර ගැනීමට .
8. නියාමනය හා පාලනය පහසු වීම.

**(01 x 2 = ලකුණු 02)**

**(ආ) 'නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?**

නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය යනු, නිෂ්පාදන කටයුතුවලට අදාළව දැරීමට සිදුවන නමුත් නිෂ්පාදන ඒකකයකට සෘජුවම වෙන්කර හඳුනාගත නොහැකි, පොදුවේ දරන පිරිවැයයි.

**(ලකුණු 02)**

**(iv) (අ) ව්‍යාපාර සැලසුමක් නිර්මාණය කිරීම සඳහා සමාගමේ දැක්ම කෙසේ උදව් වන්නේ දැයි පැහැදිලි කරන්න.**

ව්‍යාපාරය අනාගතයේ දී කවර තත්ත්වයකට ළඟා වන්නේ ද යන්න දැක්ම මගින් පෙන්වයි. ඒ අනුව ව්‍යාපාරයක් ඉදිරි උපායමාර්ග සැලසුම් කිරීමට දැක්ම තුළින් මග පෙන්වීමක් ලබා ගත හැක.

**(ලකුණු 02)**

**(ආ) නිෂ්පාදන ක්ෂේත්‍රයේ ව්‍යාපාර සැලසුම් සකස් කිරීමේ දී රටක කුසලතා සහිත ශ්‍රමිකයන් විදේශගතවීම කෙසේ බලපාන්නේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.**

1. කුසලතා සහිත සේවකයන් ලබා ගැනීමේ ගැටලු
2. වැටුප් මට්ටම් වැඩි වීම
3. පුහුණු අවශ්‍යතාව ඇති වීම
4. බඳවා ගැනීමේ පිරිවැය වැඩි වීම
5. ආයතනය කාර්යක්ෂමතාව හා ඵලදායිතාව අඩුවීම. ආදී හේතුවලට බලපානු ලැබේ.

**(ලකුණු 02)**

**(v) (අ) 'කාරක ප්‍රාග්ධන කළමනාකරණය' යනු කුමක් ද?**

එදිනෙදා අවශ්‍ය කරන අරමුදල් ලාභදායි මාර්ගවලින් සපයාගෙන ඒවා ඵලදායි මාර්ගවල යෙදවීම කාරක ප්‍රාග්ධන කළමනාකරණය ලෙස හැඳින්වේ.

**(ලකුණු 02)**

**(ආ) ව්‍යාපාරයක කාර්යසාධනය ඇගයීමට භාවිත කරන මූල්‍ය නොවන මිනුම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.**

1. පාරිභෝගික තෘප්තිය
2. සේවක තෘප්තිමත්භාවය
3. ඇල්මති පාර්ශ්වයන්ගේ පිළිගැනීම
4. ශ්‍රම පිරිවැටුම
5. ව්‍යාපාර සමාජවගකීම
6. නවෝත්පාදනය
7. භාණ්ඩ ගුණාත්මය
8. සේව්‍ය සේවක සබඳතාව
9. පාරිභෝගික පැමිණිලි අවම වීම
10. සේවක ප්‍රවාහිතාව
11. ~~සේවක පිරිවැය~~

**(01 x 2 = ලකුණු 02)**

***